# ආදායම් ක්‍රියාවලි විගණනය










ආසියා පදනම

# ආදායම් ක්‍රියාවලි විගණනය

ආසියා පදනම

Australian Aid

The Asia Foundation

ආසියා පදනම මඟින් ප්‍රකාශයට පත් කරන ලදි

පළමු සංස්කරණය,

© 2018, ආසියා පදනම

ISBN 978-955-0168-26-2

කර්තෘ
එච්. ජී. සී. ජයතිස්ස

මුද්‍රණය කරන ලද්දේ

කොළඹ, ශ්‍රී ලංකාව

**ප්‍රකාශනය සම්බන්ධයෙන්:** ඕස්ට්‍රේලියානු රජයේ සහයෝගීතාවය මධ්‍යයයේ කටයුතු කරන උප ජාතික පාලන වැඩසටහනේ ශාස්ත්‍රීය නිෂ්පාදන ගොනුවේ තවත් එක් ප්‍රකාශනයක් ලෙස මෙම ග්‍රන්ථය හැඳින්විය හැකිය. උප ජාතික පාලන වැඩසටහන ශ්‍රී ලංකාවේ පළාත් පාලනය සවිමත් කිරීමේ අරමුණින් පළාත් පාලන ආයතනයන්ගේ දරා ගැනීමේ ශක්තිය, නියෝජනය හා දුක් ගැහැට වලට පිළියම් යෙදීම යන සංරචකයන්ගේ ශක්‍යතාවය වර්ධනය කිරීම සඳහා අත්හදා බලන ලද මොඩියුලයන් හඳුන්වාදීම හා ආයතනගත කිරීම සඳහා කටයුතු කරයි. එමෙන්ම ශ්‍රී ලංකාවේ පළාත් පාලනයේ ප්‍රතිසංස්කරණයන් සඳහා උපාය මාර්ගයන් සංස්ථානය කිරීමත් ප්‍රධාන පාත්‍රයන්ගේ ධාරිතාව වර්ධනය කිරීමට අවශ්‍ය අත්හදා බලන ලද යාන්ත්‍රණයන්, ක්‍රියාවලීන් හා මොඩියුලයන් හඳුන්වාදීමත් ශක්තිමත් කිරීමත් සිදු කරයි.

සැ.යු. මෙම ග්‍රන්ථයේ සඳහන් කිසිවක් ඕස්ටේලියානු රජයේ මතය පෙන්නුම් නොකරන අතර එහි අවශ්‍ය යෙන්ම කර්තෘවරයාගේ පෞද්ගලික දෘෂ්ඨිකෝණය හා මතයන් පමණක් ගැබ් වේ.

# ආසියා පදනම

ආසියා පදනම යනු ලාභ නොලබන ජාත්‍යන්තර සංවර්ධන හා සබැඳි සංවිධානයකි. නිරන්තර වෙනස්වීම් වලට භාජනය වන්නා වූ හා සංවර්ධනය වෙමින් පවතින ආසියාවේ ජීවිත ශක්තිමත් කිරීම වෙනුවෙන් ආසියා පදනම කැපවී සිටී. දශක හයක් තුළ ලත් අත්දැකීම් ආශ්‍රයෙන් හා පන්නරය හරහා හඳුනාගත් තොරතුරු අනුව වැඩිදියුණු කළ අරමුණු 5ක් යටතේ අප ආසියා කලාපයේ සංවර්ධන කටයුතු වල නියැළේ. ඒවා නමින් පරිපාලනය ශක්තිමත් කිරීම, කාන්තාවන් බලගැන්වීම, ව්‍යාපාරික අවස්ථා පුළුල් කිරීම, පාරිසරිකව හැඩ ගැහීමට අදාළ තත්වයන් වර්ධනය කිරීම හා කලාපීය සහයෝගීතාව වර්ධනය කිරීම යන කරුණුය.

ආසියා පදනමෙහි මූලස්ථානය පිහිටා ඇත්තේ සැන්ෆ්‍රැන්සිස්කෝ නුවර වන අතර ආසියාවේ හා වොෂින්ටන් DC හා පැතිර පවතින කාර්යාල 18ක් හා ඒකාබද්ධව ආසියා පදනම වැඩකටයුතු සිදු කරයි. රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන සමග සම්බන්ධතා පවත්වන ආසියා පදනමට ද්විපාර්ශවීය හා බහුපාර්ශවීය සංවර්ධන ආයතන මගින්, පදනම් මගින්, සහයෝගිතාවයන් තුලින් හා තනි පුද්ගල ආධාර ආදී වශයෙන් නොයෙකුත් ආයතන හරහා ආධාර ගලාගෙන එයි. 2017 වර්ෂයේ ආසියානු පදනම ඇමරිකන් ඩොලර් මිලියන 83.7 ක් සෘජුවම සංවර්ධන ව්‍යාපෘති සඳහා යෙදවූ අතර පෙළපොත් සහ අනෙකුත් අධ්‍යාපනික ද්‍රව්‍යයන් වෙනුවෙන් ඇමරිකන් ඩොලර් මිලියන 8.7 ක් වැයකර ඇත.

# උප ජාතික පාලන වැඩසටහන

ආර්ථික වර්ධනයේ හා ආර්ථික ගතික ශක්ති වර්ධනයේ නැගී එන ආර්ථික කේන්ද්‍රයන් වන ද්විතීය නගරවල් වල ආර්ථික ඔරොත්තුදීමේ හැකියාව වර්ධනය උදෙසා ක්‍රියාකාරී ආර්ථික කේන්ද්‍ර සංකල්පය ගොඩනැගීම සඳහා ආසියානු පදනමේ ශ්‍රී ලංකා උප ජාතික පාලන වැඩසටහන පළාත් පාලන ආයතන නවයක මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ඇත. මෙම වැඩසටහනේ සමස්ත පුළුල් අරමුණ වනුයේ අත්දුටු අනුරූප බලාත්මක ලෙස ආයතනගත කිරීමයි.

# හැඳින්වීම

පළාත් පාලන ආයතන, තම බල ප්‍රදේශය ඇතුලත මහජන සෞඛ්‍යයට, පොදු උපයෝගිතා සේවාවන්ට සහ පොදු මංමාවත් වලට ද සාමාන්‍යයෙන් එම ප්‍රදේශය ඇතුලත ජනතාවගේ සුබ විහරණය පහසුව සහ සුබ සාධනය සහ සියලු පහසුකම් ආරක්ෂා කිරීමට සහ ප්‍රවර්ධනය කිරීමටද අදාල සියලු කරුණු විධිමත් කිරීම, පාලනය කිරීම සහ පරිපාලනය කිරීම සඳහා නෛතිකව බැඳී ඇත.

මෙම වගකිම ඉටු කිරීම සඳහා ඒ ඒ පළාත් පාලන ආයතන වලට අදාල මූලික නීතිය මගින්, විශේෂයෙන් නම් කරන ලද ආදායම් උත්පාදන මාර්ග හඳුන්වා දී ඇත. ඊට අතිරේකව අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට හා ප්‍රතිලාභීන්ගෙන් කිසියම් ගාස්තුවක් අයකර පොදු උපයෝගිතා සේවාවක් පවත්වාගෙන යාමටද නීතියෙන් බලය ලබා දී ඇත. මෙම ආදායම්, උත්පාදනයේදී හා ආදායම් පැනවීමේදී නීතියෙන් හඳුන්වා දී ඇති සම්මත ක්‍රියා පටිපාටින් අනුගමනය කල යුතුවේ. නියමිත කාර්ය පටිපාටි අනුගමනය නොකිරීම මත නීතිමය ගැටලු වලට මුහුණ පෑමට සිදුවන අතරම, විගණන විමසුම් හා අධිභාරයන්ට ලක්වීමටද ඉඩ ඇත.

පළාත් පාලන ආයතන වල ස්වයං උත්පාදන ආදායම් සම්බන්ධයෙන් අවධානය යොමු කල යුතු සම්මත කාර්ය පියවරයන් හා ආදායම් අය කිරීමේ කාර්යක්ෂමතාවය වර්ධනය කර ගැනීම සඳහා ආසියානු පදනමේ උප ජාතික පාලන වැඩසටහන (Sub National Governance Program - SNGP) මගින් ආදායම් කළමනාකරන මෙවලමක් හඳුන්වා දී ඇත. ශ්‍රී ලංකාවේ සියලු පළාත් ආවරණය වන පරිදි තෝරාගත් පළාත් පාලන ආයතන කිහිපයක සිදු කරනු ලැබූ පර්යේෂණාත්මක තක්සේරුවේ දී හඳුනාගත් ඌනතා හා අඩුපාඩුකම් මඟ හරවාලීමේ අපේක්ෂාවෙන් ආදායම් ක්‍රියාවලි විගණනය (Revenue Process Audit - RPA) නම් වූ මෙම ආදායම් කළමනාකරණ මෙවලම හඳුන්වා දී ඇත.

මෙහි ඇති මඟ පෙන්වීම් හා උපදෙස් ඇසුරින් පළාත් පාලන ආයතන වල ආදායම් නීත්‍යානුකූලව පැනවීම සහ අය කිරීමේදී අවධානය යොමු කල යුතු ක්ෂේත්‍ර හා කාර්ය පියවරයන් පිළිබඳව ලබා ගන්නා අවබෝධය තුලින් ආදායම් ප්‍රවර්ධනය කර ගැනීමටත්, විගණන විමසුම්, අධිභාර හා නෛතික ගැටලු මඟ හරවා ගැනීමටත් හැකියාව ලැබෙනු ඇතැයි අපේක්ෂා කරමි.

**එච්. ජී.සි ජයතිස්ස**
උපදේශක (නිරීති හා පළාත් පාලන)
ආසියා පදනම

# පටුන


ආසියා පදනම iii

උප ජාතික පාලන වැඩසටහන v

හැඳින්වීම vii

01 ආදායම් ක්‍රියාවලි විගණනය යනු කුමක් ද ?
What is Revenue Process Audit-(RPA) ? 1

02. ආදායම් ක්‍රියාවලි විගණනයක් අවශ්‍ය ඇයි ?
Why do we need (RPA) ? 2

03 ආදායම් ක්‍රියාවලි විගණනය මගින් ප්‍රයෝජනය ලබන්නේ කවරෙක් ද ?
Who are the beneficiaries of RPA **?** **2**

04. ආදායම් නෛතික අනුකූලතා ඇගයීම
(Revenue Legal Compliance Assessment- RLCA) 3

04.1 වරිපනම් බදු (**Assessment Tax**) 3

04.1.1 දේපල තක්සේරු කිරීම 3

04.1.2 බදු අනුප්‍රමාණය 5

04.1.3 බදු පැනවීම 6

04.1.4 තක්සේරු පොත 7

04.1.5 තක්සේරු දැන්වීම 8

04.1.6 තක්සේරු විරෝධතා 8

04.1.7 දේපලවල භෞතික වෙනස්වීම් 9

04.1.8 වරෙන්තු නිකුත් කිරීම 9

04.1.9 වට්ටම් පිරි නැමීම 10

04.2 අක්කර බදු -**Acreage Tax** **10**

04.2.1 ඉඩම් සමීක්ෂණය 11

04.2.2 අමාත්‍යවරයාගේ අනුමැතිය 11

04.2.3 අක්කර බදු සඳහා ප්‍රකාශිත විශේෂ ප්‍රදේශයන් 11

04.2.4 අක්කර බදු ලැයිස්තුව 11

| | | | |
|---|---|---|---|
| | 04.2.5 | තක්සේරු දැන්වීම | 12 |
| | 04.2.6 | සත්‍යාක්ෂණය පිළිබඳ විරෝධතා | 12 |
| | 04.2.7 | වරෙන්තු නිකුත් කිරීම | 13 |
| | 04.2.8 | වට්ටම් පිරි නැමීම | 13 |
| 04.3 | මුද්දර ගාස්තු (Stamp duty) | | 14 |
| | 04.3.1 | ප්‍රධාන නීති යටතේ අයකරගත යුතු මුද්දර ගාස්තු | 14 |
| | 04.3.2 | නියම කල නීති යටතේ වූ වෙනත් මුද්දර ගාස්තු | 15 |
| 04.4 | උසාවි දඩ (Courts Fine) | | 16 |
| | 04.4.1 | ප්‍රධාන නීති යටතේ අය කරගත යුතු උසාවි දඩ | 16 |
| 04.5 | පොදු වෙළෙඳපල කුලී (Market Rent) | | 17 |
| | 04.5.1 | පොදු වෙළඳපල කඩ කාමර කුලියට දීම | 17 |
| | 04.5.2 | ටෙන්ඩර් කිරිම/ මිළ ගණන් කැඳවිම | 18 |
| | 04.5.3 | ගිවිසුම | 18 |
| | 04.5.4 | කුලී නියම කිරීම හා අය කිරීම | 19 |
| 04.6 | තාවකාලික කඩ කුලී | | 21 |
| | 04.6.1 | කුලිය/ගාස්තුව තීරණය කිරීම | 21 |
| | 04.6.2 | ගිවිසුමකට එළඹීම | 22 |
| | 04.6.3 | ගාස්තු එකතු කිරීම | 22 |
| 04.7 | මස්කඩ වාර්ෂිකව බදු දිම | | 23 |
| | 04.7.1 | අවම ලංසුව තීරණය කිරීම | 23 |
| | 04.7.2 | ටෙන්ඩර් කැඳවීම | 24 |
| 04.8 | දින පොළ/සති පොළ ගාස්තු | | 25 |
| | 04.8.1 | ගාස්තු අයකිරීම. | 25 |
| | 04.8.2 | ටෙන්ඩර් කැඳවීම | 26 |
| 04.9 | වාහන නැවතුම් ගාස්තු (**Parking Charges**) | | 27 |
| | 04.9.1 | රථවාහන නැවතුම් ස්ථාන | 27 |

| | | |
|---|---|---|
| | 04.9.2 අතුරු ව්‍යවස්ථා | 28 |
| 04.10 | බලපත්‍ර ගාස්තු (**Trade Licence**) | 29 |
| | 04.10.1 අතුරු ව්‍යවස්ථා | 29 |
| | 04.10.2 බලපත්‍ර ගාස්තු පැනවීම | 29 |
| | 04.10.3 ගාස්තු අය කිරීම හා නෛතික ක්‍රියා මාර්ග ගැනීම | 30 |
| 04.11 | කර්මාන්ත බදු (**Trade Tax**) | 30 |
| | 04.11.1 සභා සම්මුතිය | 31 |
| | 04.11.2 බද්ද පැනවීම | 31 |
| | 04.11.3 බදු ප්‍රමාණය නියම කිරීම | 31 |
| | 04.11.4 ගාස්තු අය කිරීම හා නීතිමය ක්‍රියාමාර්ග | 31 |
| 04.12 | ව්‍යාපාර බදු (Business Tax) | 32 |
| | 04.12.1 ව්‍යපාර බද්ද නියම කිරීම හෝ පැනවීම | 32 |
| | 04.12.2 බදු අය කර ගැනීම | 33 |
| 04.13 | ගලි සේවා ගාස්තු (**Gully Service Charges**) | 33 |
| | 04.13.1 සභා සම්මුතියකින් ගාස්තු නියම කිරීම | 34 |
| | 04.13.2 අතුරු ව්‍යවස්ථා | 34 |
| | 04.13.3 ගැසට් පත්‍රය මඟින් ප්‍රසිද්ධියට පත් කිරීම | 34 |
| 04.14 | ආදාහනාගාර ගාස්තු (**Crematorium Charge**) | 35 |
| | 04.14.1 යෝජනා සම්මතයක් මඟින් ගාස්තු නියම කිරීම | 35 |
| | 04.14.2 අතුරු ව්‍යවස්ථා | 35 |
| 04.15 | ජලය විකිණීම - ( **Sale of Water**) | 36 |
| | 04.15.1 සේවාව සැපයීම සඳහා සභා සම්මුතිය ගැනීම හා ජල ගාස්තු තීරණය කිරීම | 36 |
| | 04.15.2 අතුරු ව්‍යවස්ථා | 37 |
| | 04.15.3 ගිවිසුම | 38 |
| 04.16 | වාහන හා සත්ව බදු - (**Taxes on vehicles and animals**) | 38 |
| | 04.16.1 බද්ද පැනවීම හා අයකර ගැනීම. | 38 |

4.17 සංවර්ධනය නොකළ ඉඩම් මත බදු (**Tax on un-developed land**) 39
4.17.1 බද්ද පැනවීම 40
4.17.2 අය කර ගැනීම 41
4.18. ඇතැම් ඉඩම් විකිණීම මත බදු (**Tax on certain sales of land**) 41
4.18.1 විකුණන ඉඩම් හඳුනා ගැනීම 41
4.18.2 විකුණන ඉඩම මත බද්ද අය කර ගැනීම 42
4.19. ක්‍රීඩාපිටි/නගර ශාලා/ප්‍රජාශාලා කුලී ආදායම් 43
4.19.1 ගාස්තු තීරණය කිරීම 43
4.19.2 ගාස්තු අය කර ගැනීම 44
4.20 ගොඩනැගිලි බලපත්‍ර ආදායම් 44
4.20.1 අයදුම්පත් ලබා ගැනීම 44
4.20.2 ක්ෂේත්‍ර සමීක්ෂණ 45
4.20.3 සැලසුම් කමිටුවේ අනුමැතිය 45

# 01 ආදායම් ක්‍රියාවලි විගණනය යනු කුමක් ද ?

## What is Revenue Process Audit-(RPA) ?

පළාත් පාලන ආයතනයේ වාර්ෂික අයවැය ලේඛණය අනුව අපේක්ෂිත මුළු ස්වයං උත්පාදන ආදායමට එක් එක් ආදායම් ප්‍රභවයන්ගෙන් වැඩිම දායකත්වය දරන ආදායම් ප්‍රභවය ප්‍රමුඛතා අනුපිළිවෙලින් හඳුනා ගැනීම මෙම සමීක්ෂණය ආශ්‍රයෙන් සිදු කරනු ලැබේ. පළාත් පාලන ආයතනයේ ආදායම් රටාව සංයුක්ත වී ඇති ආකාරය මේ තුලින් අවබෝධ කරගත හැකිය.එක් එක් ආදායම් ප්‍රභවයන්ගේ දායකත්වය හා වැදගත්කම ත්‍රෛමිගත හැකි සරල ප්‍රස්ථාර මේ ඇසුරින් සකස්කර ගත හැකිය. මෙමගින්න් කළමණාකරන තීරන ගැනීමටත් වර්තමාන ආදායම් ධාරාවන් සහ එහි අනාගත නැමියාවන් අවබෝධකර ගැනීමටත් මේ තුලින් (RPA) හැකියාව ලැබෙනු ඇත.




**ආදායම් ක්‍රියාවලි විගණනය ප්‍රධාන කොටස් දෙකකින් සමන්විතය.**

1. ආදායම් නෛතික අනුකූලතා ඇගයීම (Revenue Legal Compliance Assessment- RLCA)

2. ආදායම් කාර්යක්ෂමතා පටිපාටිය ඇගයීම- (Revenue Efficiency Procedural Assessment- REPA)

### ආදායම් නෛතික අනුකූලතා ඇගයීම (Revenue Legal Compliance Assessment- RLCA)

හඳුන්වා දී ඇති ආදායම් පැනවීම හා රැස්කිරීමේදී ඒ ඒ පළාත් පාලන ආයතන සංස්ථාපිත නීතිය අනුව අවධානය යොමුකල යුතු ක්ෂේත්‍රයන් හා කාර්ය පියවරයන් මොනවාද යන්න අවබෝධ කර ගැනීමට මේ තුලින් හැකියාව ලැබේ . එමෙන්ම නීතිමය හා පාලන හිඩැස් හඳුනා ගැනීමෙන් සහ

නීති රීති උල්ලංඝනය නොවන ආකාරයෙන් කටයුතු කිරීම තුලින් පළාත් පාලන ආයතන නීතිමය ගැටලු වලට මුහුණ දීමට සිදුවන අවදානම අවම කිරීම සඳහාත් ආදායම් නෛතික අනුකූලතා ඇගයීම (RLCA) වැදගත් වනු ඇත.

**ආදායම් කාර්යක්ෂමතා පටිපාටිය ඇගයීම-**
**(Revenue Efficiency Procedural Assessment- REPA)**

පළාත් පාලන ආයතනය විසින් වාර්ෂිකව ඇස්තමේන්තු කරන ලද ඒ ඒ ආදායම් ප්‍රභවයන් කාර්යක්ෂමව අයකර ගැනීම සඳහා අනුගමනය කල යුතු කාර්ය පියවරයන් නියමිත පරිදි ක්‍රියාත්මක කර ඇති ආකාරය පිළිබඳව අගැයීමක් ආදායම් කාර්යක්ෂමතා පටිපාටිය යටතේ සිදු කරනු ලැබේ. මෙම ඇගයීම තුලින් පවත්නා ඌනතා හා අඩුපාඩුකම් හඳුනාගත හැකි අතර හඳුනගන්නා ලද අඩුපාඩුකම් නිවැරදි කර ගැනීම තුලින් ආදායම් අයකර ගැනීමේ කාර්යක්ෂමතාවය වර්ධනය කර ගැනීමට හැකියාව ලැබේ.

**(ආදායම් කාර්යක්ෂමතා පටිපාටිය ඇගයීම පිළිබඳව වෙනම අත්පොතක් නිකුත්කර ඇත.)**

## 02. ආදායම් ක්‍රියාවලි විගණනයක් අවශ්‍ය ඇයි ?
## Why do we need (RPA) ?

පළාත් පාලන ආයතන වලට නීතියෙන් හඳුන්වා දී ඇති ආදායම් උපයා ගැනීමට කටයුතු කරන නමුදු එකී ආදායම් ප්‍රභවයන් පැනවීම හා ඒකරාශිකරණයේදී අනුගමනය කල යුතු නීතිමය අනුකූලතාවයන් පිළිබඳ පුලුල් දැනුවත් භාවයක් නොමැති බැව් මේ සම්බන්ධයෙන් සිදු කරනු ලැබූ ඇගයීමේදී අනාවරණය වී ඇත. මේ හේතුකොට ගෙන ආදායම් එකතු කිරීමේදී හා නෛතික ක්‍රියාමාර්ග ගැනීමේදී ගැටලුකාරි තත්ත්වයන්ට මුහුණ පෑමට සිදුවනු ඇත. එබැවින් විශේෂයෙන් ආදායම් උත්පාදනයේදී මතුවන මෙම අපහසුතා මග හරවා ගෙන නීතිමය අනුකූලතාවය ශක්තිමත් කර ගැනීමටත් ආදායම් අයකර ගැනීමේ කාර්යක්ෂමතාවය වර්ධනය කර ගැනීමටත් ඒ ආශ්‍රිතව පැන නගින උපයෝගිතාවයන් සඳහා ඵලදායි විසඳුමක් ලබාදීම සඳහාත් ආදායම් ක්‍රියාවලි විගණනය වැදගත් වේ.

## 03 ආදායම් ක්‍රියාවලි විගණනය මගින් ප්‍රයෝජනය ලබන්නේ කවරෙක් ද ?
## Who are the beneficiaries of RPA ?

i. පළාත් පාලන ආයතන වල ප්‍රතිපත්තිමය තීරන ගන්නා දේශපාලන අධිකාරිය හා විධායක නායකත්වය

ii. පළාත් පාලන ආයතන වල ආදායම් උත්පාදනය පිළිබඳ ව්‍යවස්ථාපිත වගකීම පැවරී ඇති නාගරික කොමසාරිස්/ සභා ලේකම් වරුන්

iii. පළාත් පාලන ආයතනයේ ආදායම් පරීක්ෂක හා ආදායම් උත්පාදන විෂයෙහි නියුතු නිළධාරි මණ්ඩලය

iv. පළාත් පාලන ආයතන වලට මඟ පෙන්වීම, උපදෙස් දීම හා අධීක්ෂණය භාරවී ඇති පළාත් පාලන දෙපාර්තමේන්තුවේ පළාත් පාලන කොමසාරිස්, සහකාර කොමසාරිස්වරුන් සහ විමර්ශණ නිළධාරින්

## 04. ආදායම් නෛතික අනුකූලතා ඇගයීම (Revenue Legal Compliance Assessment- RLCA)

පළාත් පාලන ආයතන වල ස්වයං උත්පාදන ආදායම් පැනවීම හා අය කිරීමේදී නිත්‍යානුකූලව අවධානය යොමු කළ යුතු විෂය ක්ෂේත්‍රයන් හා අනුගමනය කළ යුතු කාර්ය පියවරයන් පහත දක්වා ඇත.

### 04.1 වරිපනම් බදු (Assessment Tax)

ස්වයං උත්පාදන ආදායම් අතුරින් සමස්ත ආදායමට වැඩි දායකත්වයක් දක්වන ආදායම් ප්‍රභවයක් වන්නේ වරිපනම් බදු වේ. වරිපනම් බදු සම්බන්ධයෙන් වන නෛතික විධිවිධාන ඒ ඒ පළාත් පාලන ආයතන සංස්ථාපිත අනපනත් වල අන්තර්ගතව ඇත. ඒ අනුව වරිපනම් බදු අය කිරීමේදී අවධානය යොමු කළ යුතු විෂය ක්ෂේත්‍රයන් පහත දැක්වේ.

අවධානය යොමු කළ යුතු විෂය ක්ෂේත්‍රයන් (Attention Area)

i. දේපල තක්සේරු කිරීම

ii. බදු අනුප්‍රමාණය

iii. බදු පැනවීම

iv. තක්සේරු පොත

v. තක්සේරු දැන්වීම

vi. තක්සේරු විරෝධතා

vii. දේපලවල භෞතික වෙනස්වීම්

viii. වරෙන්තු නිකුත් කිරීම

ix. වට්ටම් පිරිනැමීම

#### 04.1.1 දේපල තක්සේරු කිරීම

මීට අදාලව නෛතික අනුගමනය කළ යුතු කාර්ය පියවරයන් පහත දැක්වේ. (Compliance Procedures)

i. **දියුණු කළ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කිරිම -**
***නෛතික යොමුව - - (1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 134(1)***

වරිපනම් බදු අය කල යුතු ප්‍රදේශය දියුණු කළ යුතු ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම නෛතික අවශ්‍යතාවයක් වන අතර එසේ ප්‍රකාශයට පත් කිරීමේදී පහත දැක්වෙන කාර්ය පියවරයන් අනුගමනය කල යුතුය. (දියුණු කළ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කිරිම සම්බන්ධයෙන් වෙනම මාර්ගෝපදේශ සංග්‍රහයක් නිකුත්කර ඇත.)

- දියුණු ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කිරිමට බල ප්‍රදේශය හඳුනා ගැනීම
- යෝජිත බල ප්‍රදේශය සඳහා සිතියමක් සැකසීම
- දේපල හිමිකාරත්වය පිලිබඳ වාර්තා සැකසීම
- දියුණු කළ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම සඳහා යෝජනාවක් කෙටුම්පත් කිරිම හා ඒ සඳහා සභා සම්මුතියක් ලබා ගැනීම
- පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ අනුමැතිය සඳහා යොමු කිරිම
- පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ අනුමැතිය ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කිරීම
- ප්‍රදේශයේ ජනතාව දැනුවත් කිරීම
- දේපල තක්සේරු කිරීම සඳහා විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීම
- දේපලවල වාර්ෂික වටිනාකම තක්සේරු කිරීම
- වරිපනම් බදු අනු ප්‍රමාණය කොපමණද යන්න ගැන සභා තීරණයක් ගැනීම හා ඒ සඳහා විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීම
- වරිපනම් බදු පැනවීම

ii. *දේපල තක්සේරු කිරීම සඳහා අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීම*
***නෛතික යොමුව - ම.න.ස ආඥා පනතේ 230(1) හා න.ස ආඥා පනතේ 160(1)***

පළාත් පාලන ආයතනයක් විසින් කලින්කල සභාව විසින් අවශ්‍ය යැයි කල්පනා කරන අවස්ථාව වලදී අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව බල ප්‍රදේශය තුල පිහිටි සියලුම ඉඩම් වල හා කවර වූ හෝ ගෙපත් වල ද වාර්ෂික වටිනාකම මත යම් වරිපනම් බද්දක් හෝ වරිපනම් බදු සැකසීම සඳහා දේපල තක්සේරු කිරීමක් කළ යුතුය.

iii. සහකාර කොමසාරිස් ගේ අනුමැතිය ලබා ගැනීම
***නෛතික යොමුව - ප්‍රාදේශීය සභා පනතේ 134(1)***
***අර්ථ කථනය පිළිබඳ ආඥා පනතේ 17(1)***

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයක් තුල ඇති කිසියම් ප්‍රදේශයක් දියුණු කළ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම සඳහා යෝජනාවක් කෙටුම්පත් කර එකී යෝජනාව සභා සම්මත කිරීමෙන් අනතුරුව ඒ සඳහා පළාත් පාලන සහකාර කොමසාරිස් වරයාගේ අනුමැතියට ඉදිරිපත් කළ යුතුය. ඉන් අනතුරුව සහකාර කොමසාරිස් ගේ අනුමැතිය ලබා ගත යුතු අතර එම අනුමැතිය සහකාර කොමසාරිස්වරයා විසින්ම ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කල යුතුය.

iv. බදු ප්‍රතිශතය සඳහා අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීම
***නෛතික යොමුව - ම.න.ස ආඥා පනතේ 230(1) හා න.ස ආඥා පනතේ 160(1)***

පළාත් පාලන ආයතන බල ප්‍රදේශයක් තුල පිහිටියාවූ යම් නිශ්චල දේපලක හෝ නිශ්චල දේපල වර්ගයක වාර්ෂික වටිනාකම මත අය කරනු ලබන වරිපනම් බදු ප්‍රතිශතය සඳහා විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගත යුතුය.

### 04.1.2 බදු අනුප්‍රමාණය

මීට අදාලව නෛතික අනුගමනය කළ යුතු කාර්ය පියවරයන් පහත දැක්වේ. (Compliance Procedures)

i. වෙනස් වන බදු අනුප්‍රමාණයන් නියම කිරීම
***නෛතික යොමුව - 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 134(2), ම.න.ස ආඥා පනතේ 230(1අ), න.ස ආඥා පනතේ 160(2)***

ප්‍රාදේශීය සභාවක් විසින්, දියුණු කළ ප්‍රදේශයන් සඳහා හෝ එහි කොටස් සඳහා සංවර්ධන මට්ටම සැලකිල්ලට ගෙන වෙනස් වන බදු ප්‍රමාණයන් නියම කළ හැකිය. එමෙන්ම නාගරික පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් වූ විට යම් සභාවක් විසින් බල ප්‍රදේශයේ වෙන් වෙන් ප්‍රදේශ හෝ කොටස් සඳහා, ඒ එක් එක් ප්‍රදේශයට හෝ කොටසක සභාව විසින් සලස්වා ඇති සේවාවන් අනුව, වෙන් වෙන් වරිපනම් බදු ප්‍රමාණයක් නියම කළ හැකිය.

ii. වාණිජ දේපල සඳහා වැඩි වරිපනම් බදු ප්‍රතිශතයක් පැනවීම
***නෛතික යොමුව - ම.න.ස ආඥා පනතේ 230(1අඅ), න.ස ආඥා පනතේ 160(1අ)***

මේ සඳහා නෛතික බලය පැවරී ඇත්තේ නාගරික පළාත් පාලන

ආයතන වලට පමණි. ඒ අනුව නාගරික පළාත් පාලන බල ප්‍රදේශ තුල වෙළෙඳ හෝ වාණිජ කාර්ය සඳහා පාවිච්චි කරනු ලබන දේපල සඳහා අමාත්‍යවරයාගේ අනුමැතිය අනුව වැඩි බදු ප්‍රතිශතයක් පැනවීමට හැකියාව ඇත.

iii. බදු අනුප්‍රමාණය අඩු වැඩි කිරීමේදී අමාත්‍යවරයාගේ අනුමැති ලබා ගැනීම
***නෛතික යොමුව - ම.න.ස සභා ආඥා පනතේ 230(2) (ආ)***
***න.ස ආඥා පනතේ 160(3), ප්‍රා. ස පනතේ 134(5)***

යම් වර්ෂයක් සඳහා වරිපනම් බදු පැනවීමේදී, සභාව විසින් කලින් වූ වර්ෂයේ බල පැවැත්වූ වරිපනම් බදු අනුප්‍රමාණයේ වෙනසක් සිදු කරන්නේ නම් ඒ සඳහා විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගත යුතුය.

iv. වඩා අඩු වාර්ෂික වටිනාකම මත බද්දෙන් නිදහස් කිරීම
***නෛතික යොමුව ම.න ස සභා ආඥා පනතේ 230(1අආ), න.ස ආඥා පනතේ 160(1අඅ)***

වඩා අඩු වාර්ෂික වටිනාකමක් ඇති බවට සභාව තීරණය කළ නේවාසික ස්ථාන, වරිපනම් බද්දෙන් නිදහස් කිරීමට සභාව අපේක්ෂා කරන්නේ නම් එසේ තීරණය කිරීමේදී ලිඛිත නීතියේ ඇති විධිවිධාන කෙරෙහි අවධානය යොමු කළ යුතු අතර බද්දෙන් නිදහස් කිරීමට පෙරාතුව විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීම නීතිමය අවශ්‍යතාවයක් වේ.

### 04.1.3 බදු පැනවීම

මීට අදාලව නෛතික අනුගමනය කළ යුතු කාර්ය පියවරයන් පහත දැක්වේ. (Compliance Procedures)

i. වාර්ෂිකව වරිපනම් බද්ද පැනවීම
***නෛතික යොමුව - ප්‍රා.ස. පනතේ 134(5, ම.න.ස ආඥා පනතේ 230(2), න.ස ආඥා පනතේ 160 (3)***

බද්ද පැනවීම පිළිබඳව සභා තීරණයක් ගෙන වාර්ෂිකව බදු පැනවීම සිදු කළ යුතුය. පළාත් පාලන ආයතනයක මුදල් වර්ෂය ජනවාරි පලවෙනි දින ආරම්භ වී අදාල වර්ෂයේ දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වේ. නීතියේ ඇති විධිවිධාන අනුව “වරිපනම් බද්ද හෝ වරිපනම් බදු මාස 12 ක් නොඉක්මවන යම් කාලසීමාවක් පැවතිය යුතුය.” ( ම.න.ස 230 (2) (අ) ). එමෙන්ම යම් වර්ෂයක් සඳහා වරිපනම් පැනවීමේදී දේපලවල වාර්ෂික වටිනාකම අනුගාමී වර්ෂය සඳහා පිළිගැනීමට සභා සම්මුතියක් ගත යුතුය. මීට හේතු වන්නේ දේපලවල තක්සේරුව බලපවත්වන්නේ

එක් වර්ෂයක් සඳහා පමණක් වීමය. එබැවින් කිසියම් වර්ෂයක් සඳහා පනවනු ලබන වරිපනම් බද්ද වලංගු වන්නේ අදාල වර්ෂයට පමණි. ඒ හේතුවෙන් වරිපනම් බදු වාර්ෂිකව පැනවීම නිතිමය අවශ්‍යතාවයක් වේ.

ii. සභා තීරණය ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කිරීම
*නෛතික යොමුව - අර්ථ කථනය පිළිබඳ ආඥා පනතේ 17 (1)*

බද්ද පැනවීම පිළිබඳ සභාව විසින් ගන්නා ලද තීරනය 12 වන අධිකාරය වූ අර්ථ නිරූපන ආඥා පනතේ ඇති විධිවිධානයන් අනුව ත්‍රෛයිභාෂිකව ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත්කල යුතුය.

### 04.1.4 තක්සේරු පොත

මීට අදාලව නෛතික අනුගමනය කළ යුතු කාර්ය පියවරයන් පහත දැක්වේ. (Compliance Procedures)

i. තක්සේරු පොත
*නෛතික යොමුව - ම.න ස 235(1), න.ස 166 සහ ප්‍රා.ස 141(1)*

සෑම පළාත් පාලන ආයතනයක්ම තක්සේරු ලැයිස්තුව/තක්සේරු පොතක් පවත්වාගෙන යාමට පියවර ගත යුතුය. වරිපනම් බල ප්‍රදේශය තුල වූ එක් එක් නිවාසය, ගොඩනැගිල්ල, ඉඩමේ හෝ ගෙපතේ සෑම අවුරුද්දකම වාර්ෂික වටිනාකමක් ඇතුලත් කර තිබිය යුතු "තක්සේරු පොත" ක් ( Assessment Register) පවත්වාගෙන යාම ඒ ඒ පළාත් පාලන ආයතන සංස්ථාපිත අනපනත් අනුව ඉටු කල යුතු නෛතික අවශ්‍යතාවයක් වේ.

ii. දැන්වීමක් මඟින් ජනතාව දැනුවත් කිරිම
*නෛතික යොමුව - ම.න.ස 235(1), න.ස 166 සහ ප්‍රා.ස 141(1)*

තක්සේරු ලැයිස්තුව/තක්සේරු පොත පිළිබඳව හා එය පරීක්ෂා කර බැලීම සඳහා තබා ඇති ස්ථානය පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීමක් මගින් බදු ගෙවන්නන් දැනුවත් කළ යුතුය.

iii. ගාස්තුවක් අය කිරීමකින් තොරව පරික්ෂා කිරීමට ඉඩ ලබාදීම
*නෛතික යොමුව - ප්‍රා.ස පනතේ 141(2), ම.න.ස 235(2), න.ස 166*

යම් ගෙයක, ගොඩනැගිල්ලක, ඉඩමක හෝ ගෙපතක සෑම අයතිකරුවෙකුට හෝ පදිංචිකරුවෙකුට හෝ ඔහුගේ බලය ලත් නියෝජිතයෙකුට සිය ස්ථානයකට අදාල වන එකී තක්සේරු පොතේ යම් කොටසක් කිසිදු ගාස්තුවක් අය නොකර පරීක්ෂා කර බැලීමට අවසර දිය යුතුය.

### 04.1.5 තක්සේරු දැන්වීම

මීට අදාලව නෛතික අනුගමනය කළ යුතු කාර්ය පියවරයන් පහත දැක්වේ. (Compliance Procedures)

i. තක්සේරු දැන්වීමක් නිකුත් කිරීම
***නෛතික යොමුව - ම.න.ස ආඥා පනතේ 235(3), න.ස ආඥා පනතේ 166, ප්‍රා.ස පනතේ 141(3)***

තක්සේරු කරන ලද නිවසක, ගොඩනැගිල්ලක, ඉඩමක අයිතිකරු/ පදිංචිකරු /හවුල් අයිතිකරු හෝ කුලී නිවැසියා වුවත්, එකී සෑම පදිංචිකරුවෙකුටම ත්‍රෛභාෂිකව පිළියෙල කරන ලද තක්සේරු දැන්වීමක් භාර දීමට හෝ එම ස්ථානයේ තැබීමට පියවර ගත යුතුය.

### 04.1.6 තක්සේරු විරෝධතා

මීට අදාලව නෛතික අනුගමනය කළ යුතු කාර්ය පියවරයන් පහත දැක්වේ. (Compliance Procedures)

i. තක්සේරු විරෝධතා කැඳවීම
***නෛතික යොමුව - ම.න.ස ආඥා පනතේ 235(4), න.ස ආඥා පනතේ 166, ප්‍රා.ස පනතේ 141(3)***

තක්සේරු දැන්වීම භාරදුන් දින සිට දින 30 ක් ඇතුලතදී විරෝධතා ඇත්තේ නම් ලිඛිතව සභාවට ඉදිරිපත් කළ යුතු බව තක්සේරු දැන්වීමේ සටහන් කර තිබිය යුතුය.

ii. තක්සේරු විරෝධතා පොතක් පවත්වාගෙන යාම
***නෛතික යොමුව - ම.න.ස ආඥා පනතේ 235(5), න.ස ආඥා පනතේ 166, ප්‍රා.ස පනතේ 141(4)***

පළාත් පාලන ආයතනය විසින් “විරෝධතා පොත“ (Objection Register) නමින් හඳුන්වනු ලබන පොතක් තබා ගත යුතු අතර, එහි තක්සේරුව සම්බන්ධයෙන් වූ සෑම විරෝධතාවක්ම ලේඛනගත කල යුතුය.

iii. විරෝධතා විමර්ශණ දිනය දැනුම්දීම
*නෛතික යොමුව - ම.න.ස ආඥා පනතේ 235(5), න.ස ආඥා පනතේ 166, ප්‍රා.ස පනතේ 141(4)*

එක් එක් විරෝධකයෙකුගේ විරෝධතා විමර්ෂණය කරනු ලබන දිනය, ස්ථානය හා වේලාව පළාත් පාලන ආයතනය විසින් ඒ විරෝධකයාට ලියවිල්ලකින් දැනුම් දිය යුතුය

iv. විරෝධතා විමර්ෂණය
*නෛතික යොමුව - ම.න.ස ආඥා පනතේ235(6) න.ස ආඥා පනතේ 166, ප්‍රා.ස පනතේ 141(5)*

නියම කරන ලද වේලාවේදී හා ස්ථානයේදී පළාත් පාලන ආයතනය විසින්, විරෝධපාන්නා, අයිතිකරු සහ පදිංචිකරු හෝ ඔවුන්ගේ බලය ලත් අනු නියෝජිතයන් පැමිණ සිටින්නේ නම් ඔවුන් ඉදිරියේදී විරෝධතා විමර්ෂණය කිරීමට සැලැස්විය යුතුය .

v. තීරණය විරෝධකයාට දැනුම් දීම
*නෛතික යොමුව - ම.න.ස ආඥා පනතේ 235(7) න.ස ආඥා පනතේ 166, ප්‍රා.ස පනතේ 141(6)*

තක්සේරුවක් සම්බන්ධයෙන් හෝ යම් විරෝධතාවක් පිළිබඳ සුදුස්සක් කරනු ලැබූ කල්හි ඒ පිළිබඳ තීරණය විරෝධකයාට දැනුම් දීමට සැලැස්විම ද එම තීරණය විරෝධතා පොතෙහි සටහන් කිරීමටද වරිපනම් පොතෙහි යම් අවශ්‍ය සංශෝධනයන් කිරීමද සභාව විසින් කළ යුතුය.

### 04.1.7 දේපලවල භෞතික වෙනස්වීම්

මීට අදාලව නෛතික අනුගමනය කළ යුතු කාර්ය පියවරයන් පහත දැක්වේ. (Compliance Procedures)

i. දේපල තක්සේරු කිරීම
*නෛතික යොමුව - ප්‍රා.ස පනතේ 143(1), ම.න.ස ආඥා පනතේ 237(1), න.ස ආඥා පනතේ 166*

යම් ගෙයක,ගොඩනැගිල්ලක, ඉඩමක හෝ ගෙපතක වාර්ෂික වටිනාකමට බලපාන ලෙස එහි භෞතික වෙනස් කිරීම් කරන ලද අවස්ථාවක, පළාත් පාලන ආයතනයක් විසින් ඕනෑම අවස්ථාවක එකී දේපල අලුත් තක්සේරුවක් පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය.

### 04.1.8 වරෙන්තු නිකුත් කිරීම

මීට අදාලව නෛතික අනුගමනය කළ යුතු කාර්ය පියවරයන් පහත දැක්වේ. (Compliance Procedures)

i. දේපල තහනම් කිරීමට වරෙන්තු නිකුත් කිරීම
*නෛතික යොමුව - ම.න.ස ආඥා පනතේ 252, න.ස ආඥා පනතේ 166 හා 170 ප්‍රා.ස 158(1)*

වරිපනම් බදු ගෙවීම් පැහැර හැරීම මත සමුච්චිත හිඟ වරිපනම් අය කර ගැනීම සඳහා අදාල ස්ථානයක් තුල හෝ ඒ මත ඇති කවර වූ හෝ

තැනැත්තෙකුට වුවද අයත් සියලුම චංචල දේපලක්ම සහ ඒ වරිපනම් බද්ද අයවිය යුතුව ඇත්තේ යම් නිශ්චල දේපලක්ම තහනමට ගැනීම සඳහා වූ බලපත්‍රයක් නිකුත් කිරීමට නාගරික කොමසාරිස්/ලේකම් විසින් පියවර ගත යුතුය.

ii. වරෙන්තු ක්‍රියාත්මක කිරීම
***නෛතික යොමුව - ප්‍රා.ස 158(1) හා ප්‍රා. ස මූල්‍ය හා පරිපාලන රීති 42, ම.න.ස ආඥා පනතේ 252, න.ස ආඥා පනතේ 166 හා 170***

වරිපනම් බදු ගෙවීම් පැහැර හරින්නන්ගේ දේපල තහනම් කිරීමට අදාලව නිකුත් කරන ලද වරෙන්තු ක්‍රියාත්මක කිරීමට පියවර ගත යුතුය.

### 04.1.9 වට්ටම් පිරි නැමීම

මීට අදාලව නෛතික අනුගමනය කළ යුතු කාර්ය පියවරයන් පහත දැක්වේ. (Compliance Procedures)

i. කලින් බදු ගෙවන්නට වට්ටම් පිරිනැමීම
***නෛතික යොමුව - ප්‍රා.ස පනතේ 134(7)***

වාර්ෂිකව වරිපනම් බද්ද අදාල වර්ෂයේ ජනවාරි 31 වන දිනට පෙර ගෙවන්නේ නම් ගෙවිය යුතු බදු වටිනාකමින් 10% ක් හා කාර්තුවකට අදාල වරිපනම් බද්ද කාර්තුවේ මුල් මාසය තුල ගෙවන්නන්හට 5% ක වටට්මක් ලබා දීමට පියවර ගත යුතුය.

### 04.2 අක්කර බදු -Acreage Tax

පළාත් පාලන ආයතන අතුරින් ප්‍රාදේශීය සභා වලට පමණක් සීමාවූ මෙම ආදායම් මාර්ගය දේපල මත අය කරන ආදායම් ප්‍රභවයක් වේ. අක්කර බදු නියම කිරීම හා අය කිරීමට අදාලව අනුගමනය කළ යුතු විෂය ක්ෂේත්‍රයන් හා කාර්ය පියවරයන් පහත දක්වා ඇත.

අවධානය යොමු කළ යුතු විෂය ක්ෂේත්‍රයන් ( Attention Area)

i. ඉඩම් සතොයක්ෂණය
ii. අමාත්‍යවරයාගේ අනුමැතිය
iii. අක්කර බදු සඳහා ප්‍රකාශිත විශේෂ ප්‍රදේශයන්
iv. අක්කර බදු ලැයිස්තුව
v. තක්සේරු දැන්වීම
vi. සතොයක්ෂණය පිළිබඳ විරෝධතා
vii. වරෙන්තු නිකුත් කිරිම
viii. වට්ටම් පිරිනැමීම

### 04.2.1 ඉඩම් සනොයක්ෂණය

මීට අදාලව නෛතික අනුගමනය කළ යුතු කාර්ය පියවරයන් පහත දැක්වේ. (Compliance Procedures)

i. සනොයක්ෂණය සඳහා තැනැත්තන් පත් කිරීම
   ***නෛතික යොමුව - ප්‍රා. ස පනතේ 140(2)***

   අක්කර බද්ද සඳහා සියලු වගා කල ඉඩම් වල ප්‍රමාණය නිර්ණය කිරීමේ කාර්ය සඳහා තක්සේරුකරුවන් ලෙස ක්‍රියා කිරීම පිණිස එක් තැනැත්තෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් පත් කිරීමට ප්‍රාදේශීය සභාවකට බලය ඇත්තේය.

### 04.2.2 අමාත්‍යවරයාගේ අනුමැතිය

මීට අදාලව නෛතික අනුගමනය කළ යුතු කාර්ය පියවරයන් පහත දැක්වේ. (Compliance Procedures)

i. අක්කර බදු නියම කිරීම හා අයකිරීම
   ***නෛතික යොමුව - ප්‍රා. ස 134(3)***

   ප්‍රාදේශීය සභාව විසින්, සභා සීමාව ඇතුලත පිහිටියාවූ ද, ස්ථිර හෝ නිතිපතා ගොවිතැනක් යටතේ වූද එක් එක් ඉඩම් හෙක්ටයාරය මත අක්කර බද්දක් නියම කිරීමට හා අය කිරීමට විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීම නිතිමය අවශ්‍යතාවයක් වේ.

### 04.2.3 අක්කර බදු සඳහා ප්‍රකාශිත විශේෂ ප්‍රදේශයන්

මීට අදාලව නෛතික අනුගමනය කළ යුතු කාර්ය පියවරයන් පහත දැක්වේ. (Compliance Procedures)

i. විශේෂ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කර තිබේද යන්න සොයා බැලීම
   ***නෛතික යොමුව - ප්‍රා.ස පනතේ 134(3) වගන්තියේ හා 1989.02.03 දිනැති සඩ (ආ) දරන ගැසට් නිවේදනය***

   ඉඩම් හෙක්ටයාර් පහකට අඩුවූ ඉඩම්, අක්කර බද්දට යටත් කිරීම සඳහා එකී ප්‍රදේශ අමාත්‍යවරයා විසින් විශේෂ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කර තිබේද යන්න ගැන විමසිලිමත් විය යුතුය. ඊට ඇතුලත් නොවන්නේ නම් හෙක්ටයාර් පහකට අඩු ඉඩම් බද්දට යටත් කළ නොහැක.

### 04.2.4 අක්කර බදු ලැයිස්තුව

මීට අදාලව නෛතික අනුගමනය කළ යුතු කාර්ය පියවරයන් පහත දැක්වේ. (Compliance Procedures)

i. අක්කර බදු ලැයිස්තුව පිළිබඳ ජනතාව දැනුවත් කිරීම
*නෛතික යොමුව - ප්‍රා. ස පනතේ 141(1)*

අක්කර බදු ලැයිස්තුවක් පිළියෙල කිරීම අවසන් කළ පසු ඒ පිළිබඳව සහ එකී ලැයිස්තුව පරීක්ෂා කර බැලිය හැකි ස්ථානය පිළිබඳව ප්‍රාදේශීය සභාව විසින් ප්‍රසිද්ධ දැන්වීමක් කිරීමට සැලැස්විය යුතුය.

ii. පරීක්ෂාව සඳහා ගාස්තු අය නොකල යුතු බව
*නෛතික යොමුව - ප්‍රා.ස පනතේ 141(2)*

අක්කර බදු ලැයිස්තුවේ යම් කොටසක් පරීක්ෂා කර බැලීමට අය කිරීමකින් තොරව යම් තැනැත්තෙකුට අවසර දිය යුතුය.

## 04.2.5 තක්සේරු දැන්වීම

මීට අදාලව නෛතික අනුගමනය කළ යුතු කාර්ය පියවරයන් පහත දැක්වේ. (Compliance Procedures)

i. තක්සේරු දැන්විමක් නිකුත් කිරීම
*නෛතික යොමුව - ප්‍රා.ස පනතේ 141(3)*

සතොයක්ෂණය කරන ලද ඉඩම් ප්‍රමාණය පිළිබඳව තක්සේරු දැන්වීමක් අදාල දේපලේ පදිංචිකරු/අයිතිකරු හෝ කුලී නිවැසියා වෙත භාර දීමට හෝ එම ස්ථානයේ තැබීමට ප්‍රාදේශීය සභාව විසින් පියවර ගත යුතුය

## 04.2.6 සතොයක්ෂණය පිළිබඳ විරෝධතා

මීට අදාලව නෛතික අනුගමනය කළ යුතු කාර්ය පියවරයන් පහත දැක්වේ. (Compliance Procedures)

i. විරෝධතා කැඳවීම
*නෛතික යොමුව - ප්‍රා.ස පනතේ 141(3)*

තක්සේරු දැන්වීම භාරදුන් දින සිට දින 30 ක් ඇතුලතදී විරෝධතා ඇත්තේ නම් ලිඛිතව සභාවට ඉදිරිපත් කළ යුතු බව තක්සේරු දැන්වීමේ සටහන් කර තිබිය යුතුය.

ii. විරෝධතා පොතක් පවත්වාගෙන යාම
*නෛතික යොමුව - ප්‍රා.ස පනතේ 141(4)*

"විරෝධතා පොත" (Objection Register) නමින් හඳුන්වනු ලබන පොතක් තබා ගත යුතු අතර, එහි සතොයක්ෂණය සම්බන්ධයෙන් වූ සෑම විරෝධතාවක්ම ලේඛනගත කල යුතුය.

iii. විරෝධතා විමර්ශණ දිනය දැනුම්දීම
*නෛතික යොමුව - ප්‍රා.ස පනතේ 141(4)*

එක් එක් විරෝධකයෙකුගේ විරෝධතා විමර්ෂණය කරනු ලබන දිනය, ස්ථානය හා වේලාව පළාත් පාලන ආයතනය විසින් ඒ ඒ විරෝධකයාට ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

iv. විරෝධතා විමර්ෂණය
*නෛතික යොමුව - ප්‍රා.ස පනතේ 141(5)*

නියම කරන ලද වේලාවේදී හා ස්ථානයේදී පළාත් පාලන ආයතනය විසින්, විරෝධපාන්නා, අයිතිකරු සහ පදිංචිකරු හෝ ඔවුන්ගේ බලය ලත් අනු නියෝජිතයන් පැමිණ සිටින්නේ නම් ඔවුන් ඉදිරියේදී විරෝධතා විමර්ෂණය කළ යුතුය

v. තීරණය විරෝධකයාට දැනුම් දීම
*නෛතික යොමුව - ප්‍රා.ස පනතේ 141(6)*

සත්‍යාක්ෂණය කිරීමක් සම්බන්ධයෙන් හෝ යම් විරෝධතාවක් පිළිබඳ සුදුස්සක් කරනු ලැබූ කල්හි ඒ පිළිබඳ තීරණය විරෝධකයාට දැනුම් දීමට සැලැස්විම ද එම තීරණය විරෝධතා පොතෙහි සටහන් කිරීමටද අක්කර බදු ලැයිස්තුවෙහි යම් අවශ්‍ය සංශෝධනයන් කිරීමද සභාව විසින් කළ යුතුය.

### 04.2.7 වරෙන්තු නිකුත් කිරීම

මීට අදාලව නෛතික අනුගමනය කළ යුතු කාර්ය පියවරයන් පහත දැක්වේ. (Compliance Procedures)

i. දේපල තහනම් කිරීමට වරෙන්තු නිකුත් කිරීම
*නෛතික යොමුව - ප්‍රා.ස පනතේ 158(1) වගන්තියේ සහ ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති 42 හා 43*

අක්කර බදු ගෙවීම් පැහැර හැරීම මත සමුච්චිත හිඟ අක්කර බදු අය කර ගැනීම සඳහා අදාල ස්ථානයක් තුල හෝ ඒ මත ඇති කවර වූ හෝ තැනැත්තෙකුට වුවද අයත් සියලුම චංචල දේපලක්ම තහනමට ගැනීම සඳහා වූ බලපත්‍රයක් නිකුත් කිරීමට සභා ලේකම් ගේ රාජකාරිමය වගකීමක් වන්නේය.

### 04.2.8 වට්ටම් පිරි නැමීම

මීට අදාලව නෛතික අනුගමනය කළ යුතු කාර්ය පියවරයන් පහත දැක්වේ. (Compliance Procedures)

ii. කලින් බදු ගෙවන්නට වට්ටම් පිරිනැමීම
*නෛතික යොමුව - ප්‍රා.ස පනතේ 134(7)*

වාර්ෂිකව අක්කර බද්ද අදාල වර්ෂයේ ජනවාරි 31 වන දිනට පෙර ගෙවන්නේ නම් ගෙවිය යුතු බදු වටිනාකමින් 10% ක් හා කාර්තුවකට අදාල අක්කර බද්ද කාර්තුවේ මුල් මාසය තුල ගෙවන්නන් හට 5% ක වටට්මක් ලබා දීමට පියවර ගැනීම නිතිමය අවශ්‍යතාවයකි.

## 04.3 මුද්දර ගාස්තු (Stamp duty)

පළාත් පාලන ආයතන සංස්ථාපිත ප්‍රධාන නීතිය යටතේ හඳුන්වා දී ඇති මුද්දර ගාස්තු ආදායම් පළාත් පාලන ආයතන වල ප්‍රධාන ආදායම් මාර්ග යක් බවට පත්ව ඇත. ස්වයං උත්පාදන ආදායම් යටතේ සැලකෙන මෙම ආදායම් ප්‍රභවය අය කර ගැනීමට අදාල විෂය ක්ෂේත්‍රයන් හා නෛතිකව අනුගමනය කළ යුතු කාර්ය පියවරයන් පහත දක්වා ඇත.

අවධානය යොමු කළ යුතු විෂය ක්ෂේත්‍රයන් ( Attention Area)

i. ප්‍රධාන නීති යටතේ අයකරගත යුතු මුද්දර ගාස්තු

ii. නියම කල නිති යටතේ වූ වෙනත් මුද්දර ගාස්තු

### 04.3.1 ප්‍රධාන නීති යටතේ අයකරගත යුතු මුද්දර ගාස්තු

මීට අදාලව නෛතික අනුගමනය කළ යුතු කාර්ය පියවරයන් පහත දැක්වේ. (Compliance Procedures)

i. පළාත් පාලන ආයතන සංස්ථාපිත අන පනත් යටතේ වෙන් කර දෙනු ලැබූ මුද්දර ගාස්තු

*නෛතික යොමුව - ම.න.ස ආඥා පනතේ 185 වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ දෙවන උප ලේඛනයේ 1 හා 2 ඡේදයන්*

නගර සභා ආඥා පනතේ 158 වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ පස්වන උපලේඛනයේ 1 හා 2 ඡේදයන් *ප්‍රාදේශීය සභා පනතේ 129 වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 1 හා 2 ඡේදයන්*

බෝට්ටු ආඥා පනත, ගෝඝාතක ආඥ පනත, වාහන ආඥා පනත සහ විශේෂ විධිවිධාන සලස්වා ඇති වෙනත් ප්‍රඥප්තියක් යටතේ මහා නගර සභා වලට වෙන් කර දෙනු ලබන සියලු මුද්දර ගාස්තු අය කර ගැනීමට නීතියෙන් බලය පැවරී ඇත.

### 04.3.2 නියම කල නීති යටතේ වූ වෙනත් මුද්දර ගාස්තු

මීට අදාලව නෛතික අනුගමනය කළ යුතු කාර්ය පියවරයන් පහත දැක්වේ. (Complianc Procedures)

i. අධිකරණ සංවිධාන පනත යටතේ හිමි මුද්දර ගාස්තු

*නෛතික යොමුව - ම.න.ස 185 වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ දෙවන උපලේඛනයේ 3(අ) වන ඡේදය නගර සභා ආඥා පනතේ 158 වගන්තිය සමඟ කියවිය යුතු පස්වන උපලේඛනයේ 3(අ) ඡේදය*

*ප්‍රාදේශීය සභා පනතේ 129 වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 2 වන උපලේඛනයේ 3(1) (අ)*

අධිකරණ සංවිධාන පනතේ 40(2) වගන්තිය යටතේ නීතිඥවරුන් වශයෙන් ඇතුලත් කර ගැනීමේ සහතික වෙනුවෙන් අය කරනු ලබන මුද්දර ගාස්තු පළාත් පාලන ආයතනයේ මුද්දර ගාස්තු වශයෙන් අය කර ගැනීමට නෛතික ප්‍රතිපාදන සැලසී ඇත.

ii. නොතාරිස් ආඥා පනත යටතේ හිමි මුද්දර ගාස්තු

*නෛතික යොමුව - ම.න.ස 185 වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ දෙවන උපලේඛනයේ 3(ආ) වන ඡේදය*

*නගර සභා ආඥා පනතේ 158 වගන්තිය සමඟ කියවිය යුතු පස්වන උපලේඛනයේ 3(ආ) ඡේදය*

*ප්‍රාදේශීය සභා පනතේ 129 වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 2 වන උපලේඛනයේ 3(1) (ආ)*

නොතාරිස් ආඥා පනතේ 3 වන, 27 වන හා 28 වන වගන්ති යටතේ නිකුත් කරන ලද බලපත්‍ර සහතික සහ ප්‍රකාශන මත නොතාරිස් වරුන් වශයෙන් ගෙවනු ලබන මුද්දර ගාස්තු පළාත් පාලන ආයතනයේ මුද්දර ආදායම් යටතට අයත්වේ.

iii. බඩු උකස් ගන්නන් පිළිබඳ ආඥා පනත යටතේ හිමි මුද්දර ගාස්තු

*නෛතික යොමුව - ම.න.ස 185 වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ දෙවන උපලේඛනයේ 3(ඇ) වන ඡේදය*

*නගර සභා ආඥා පනතේ 158 වගන්තිය සමඟ කියවිය යුතු පස්වන උපලේඛනයේ 3(ඇ) ඡේදය*

*ප්‍රාදේශීය සභා පනතේ 129 වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 2 වන උපලේඛනයේ 3(1) (ඇ)*

පළාත් පාලන ආයතන බල ප්‍රදේශය තුල බඩු උකස් ගන්නන් පිළිබඳ ආඥා පනතේ 3 වනවගන්තිය යටතේ නිකුත් කරන බලපත්‍ර මත බඩු උකස් ගන්නන් වශයෙන් ගෙවනු ලබන මුද්දර ගාස්තු පළාත් පාලන ආයතනයේ මුද්දර ආදායම් යටතට ඇතුලත් වේ.

iv. මුද්දර ගාස්තු පනත යටතේ හිමි මුද්දර ගාස්තු

*නෛතික යොමුව - ම.න.ස 185 වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ දෙවන උපලේඛනයේ 3අ වන ඡේදය*

*නගර සභා ආඥා පනතේ 158 වගන්තිය සමග කියවිය යුතු පස්වන උපලේඛනයේ 4 වන ඡේදය*

*ප්‍රාදේශීය සභා පනතේ 129 වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 2 වන උපලේඛනයේ 4 වන ඡේදය*

පළාත් පාලන ආයතන බල සීමාව තුල පිහිටි යම් ඉඩමකට අදාල විකුණුම්කර, උකස්කර බැඳුම්කර, තෑගි ඔප්පු සහ බදුකර සම්බන්ධයෙන් මුද්දර පනත යටතේ ගෙවනු ලබන සියලුම පළාත් පාලන ආයතනයට හිමි ආදායම් මාර්ගයක් වන්නේය.

## 04.4 උසාවි දඩ (Courts Fine)

ස්වයං උත්පාදන ආදායමක් වශයෙන් උසාවි දඩ ආදායම් පළාත් පාලන ආයතන වල සමස්ත ආදායමට වැඩි දායකත්වයක් ලබා දෙන ආදායම් ප්‍රභවයක් වන්නේය. උසාවි දඩ සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු විෂය ක්ෂේත්‍රයන් හා කාර්ය පියවරයන් පහත දක්වා ඇත.

අවධානය යොමු කළ යුතු විෂය ක්ෂේත්‍රයන් ( Attention Area)

### 04.4.1 ප්‍රධාන නීති යටතේ අය කරගත යුතු උසාවි දඩ

මීට අදාලව නෛතිකව අනුගමනය කළ යුතු කාර්ය පියවරයන් පහත දැක්වේ. (Compliance Procedures)

i. ලිඛිත නීති යටතේ සභාවට හිමි උසාවි දඩ

*නෛතික යොමුව - ම.න.ස ආඥා පනතේ 163,185(2) (ආ) වගන්ති වලද, නගර සභා ආඥා පනතේ 158 වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ හතරවන උපලේඛනය*

*නගර සභා ආඥා පනතේ 158 වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ හතරවන උපලේඛනය*

ප්‍රාදේශීය සභා පනතේ 129 වන වගන්තිය සමග කියවිය යුතු එකි පනතේ පලමු වන උපලේඛනය

පළාත් පාලන ආයතන සංස්ථාපිත අණපනත් යටතේ සභාවට අයවිය යුතු උසාවි දඩ මුදල් යාවත්කාලීනව අයකර ගැනීම සභාවේ කාර්යභාරයක් වන්නේය. මේ අනුව ප්‍රාදේශීය සභා පනතේ පලමුවන උපලේඛනය යටතේ වූ (1) (2) හා (3) ඡේදවලින් හඳුන්වා දී ඇති ලිඛිත නීති වල දැක්වෙන විධිවිධාන කඩ කිරීම සම්බන්ධයෙන් යම් ප්‍රාදේශීය සභාවක් විසින් හෝ ප්‍රාදේශීය සභාවක බල ප්‍රදේශය විෂයෙහි අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් හෝ අය කරනු ලබන සියලු දඩ හා දණ්ඩන ප්‍රාදේශීය සභාවට අයත් උසාවි දඩ ආදායම් යටතට ගැනේ.

## 04.5 පොදු වෙළෙඳපල කුලී (ඵුනැඵ ඍැබඵ)

පළාත් පාලන ආයතන විසින් ඉදි කරනු ලැබ, බද්දට හෝ කුලියට දී ඇති පොදු වෙළෙඳපලක පිහිටි කඩ කාමර වලින් අය කරනු ලබන බදු කුලී මෙම ආදායම් ප්‍රභවයට ඇතුලත් වේ.

අවධානය යොමු කළ යුතු විෂය ක්ෂේත්‍රයන් (Attention Area)

i. පොදු වෙළඳපල කඩ කාමර කුලියට දීම
ii. ටෙන්ඩර් කිරිම/ මිළ ගණන් කැඳවීම
iii. ගිවිසුම
iv. කුලී නියම කිරීම හා අය කිරීම

### 04.5.1 පොදු වෙළඳපල කඩ කාමර කුලියට දීම

මීට අදාලව නෛතිකව අනුගමනය කළ යුතු කාර්ය පියවරයන් පහත දැක්වේ. (Compliance Procedures)

i. සභා සම්මුතිය

***නෛතික යොමුව - ම.න.සආඥා පනතේ 21(1) .න.ස ආඥා පනතේ 26(4), ප්‍රා.ස පනතේ 14(1)***

සභාව සතු වෙළෙඳපල කඩ කාමර බදු දීම පිළිබඳව සභාවට යෝජනා කර ඒ සඳහා බහුතරයේ එකඟතාවය මත සභා සම්මුතියක් ලබා ගැනීම අවශ්‍ය වේ.

ii. කඩ කාමර වෙළෙඳාම සඳහා වෙන්කිරීම

***නෛතික යොමුව - ම.න.සආඥා පනතේ 272(8) (ආ) න.ස ආඥා පනතේ 157 (11) (ඊ), ප්‍රා.ස පනතේ 126(ංසස)(ඊ)***

පොදු වෙළෙඳපල විධිමත් කිරිම හා පාලනය කිරීම උදෙසා සහ අදාල කඩ කාමර වෙන් කර දිම පිළිබඳව අතුරු ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීම නිත්‍යානුකුල අවශ්‍යතාවයක් වන්නේය.

iii. කුලිය තක්සේරු කිරීම

***නෛතික යොමුව - ම.න.සආඥා පනතේ 239, න.ස ආඥා පනතේ 166, ප්‍රා.ස පනතේ 140 (1)***

බද්ද හෝ කුලිය කොපමණද යන්න පිළිබඳව රජයේ තක්සේරුකරු මඟින් හෝ සභාව විසින් පත් කරන ලද සුදුසුකම් ලත් තක්සේරුකරුවකු මඟින් කඩ කාමරයේ කුලිය හෝ බද්ද තක්සේරු කල යුතුය.

## 04.5.2 ටෙන්ඩර් කිරිම/ මිළ ගණන් කැඳවිම

මීට අදාලව නෛතිකව අනුගමනය කළ යුතු කාර්ය පියවරයන් පහත දැක්වේ. (Compliance Procedures)

i. ටෙන්ඩර් කැඳවීම පිළිබඳව සභා සම්මුතියක් ලබා ගැනීම

***නෛතික යොමුව - ම.න.සආඥා පනතේ 21(1), න.ස ආඥා පනතේ 26(2), ප්‍රා.ස පනතේ 14(1)***

සභාව සතු කඩ කාමර බද්දට හෝ කුලියට දීමේදී අදාල සාර්ථක ටෙනඩර්කරු/බදුකරු තෝරා ගැනීම පිළිබඳ පළමුවෙන්ම සභාවේ එකතාවය ලබා ගත යුතුය

ii. ටෙන්ඩර් මිළ ගණන් කැඳවිම

***නෛතික යොමුව - ම.න.සආඥා පනතේ 229, ප්‍රා.ස පනතේ 174, ටෙන්ඩර් පටිපාටිය***

අදාල කඩ කාමර වෙන්කර දීම සඳහා සභාවේ තීරණය පරිදි මිළ ගනන් කැඳවීමක් හෝ ටෙන්ඩර් කැඳවීමක් සිදු කළ යුතු වේ. එය පුවත්පත් මඟින් ප්‍රසිද්ධියට පත් කල යුතු අතර පිළිගත් ටෙන්ඩර් ක්‍රියාපටිපාටියට අනුකූලව ක්‍රියාත්මක කල යුතුය.

iii. ටෙන්ඩර් මණ්ඩල නිර්දේශ සභාවට යොමු කිරීම

**නෛතික යොමුව - ම.න.සආඥා පනතේ 21(1) න.ස ආඥා පනතේ 26(2) ප්‍රා.ස පනතේ 14(1) *පළාත් පාලන කොමසාරිස් ගේ චක්‍රල්ඛ උපදෙස්***

ලැබුණු ටෙන්ඩර්, මිල කියුම් ටෙන්ඩර් කමිටුවක් මඟින් විවෘත කර සාර්ථක ටෙන්ඩර්කරු තෝරා ගැනීම විධිමත් ක්‍රමය වන්නේය.

## 04.5.3 ගිවිසුම

මීට අදාලව නෛතිකව අනුගමනය කළ යුතු කාර්ය පියවරයන් පහත දැක්වේ. (Compliance Procedures)

i. ගිවිසුමකට එළඹීම

*නෛතික යොමුව - ම.න.ස 40(1) (උ), 227, 228, න.ස පනතේ 36(ඊ), ප්‍රා.ස පනතේ 173, ගිවිසුම් නීතිය, පළාත් පාලන කොමසාරිස් විසින් නිකුත් කර ඇති චක්‍රලේඛ*

සභාව සතු වෙළඳපල කඩ කාමර බද්දට හෝ කුලියට දීමේදී බදුකරු/කුලීකරු සමග ලිඛිත බදු ගිවිසුමකට එළඹිය යුතුය. එකී ගිවිසුමට දෙපාර්ශ්වයම අත්සන් කළ යුතු අතර ප්‍රාදේශීය සභාවක් සම්බන්ධයෙන් වූ කලී එම ගිවිසුමට සභාව වෙනුවෙන් සභාපති හා ලේකම් යන දෙදෙනාම අත්සන් කර සභාවේ පොදු මුද්‍රාව තැබිය යුතුය. මහා නගර සභා සම්බන්ධයෙන් වූ විට නගරාධිපති හා නාගරික කොමසාරිස් යන දෙදෙනොම ගිවිසුමට අත්සන් කිරීම නීත්‍යානුකූල අවශ්‍යතාවයක් වේ. නගර සභාවක් සම්බන්ධයෙන් වූ විට සභාපතිවරයාට ගිවිසුම සඳහා එළඹීමට නීතිමය බැඳියාවක් ඇත.

ii. ගිවිසුමේ අන්තර්ගතය

*නෛතික යොමුව - ගිවිසුමේජජ කොන්දේසි, 1995 අංක 11 දරණ බේරුම්කිරීම් පනතේ විධිවිධාන*

කිසියම් බදුදීමක් හෝ කුලියට දීමක් සිදුවන අවස්ථාවකදී අත්සන් කරනු ලබන බදු ගිවිසුමට අන්තර්ගත කොන්දේසි වලට කුලිය හෝ බද්දට දෙනු ලබන දේපල සම්බන්ධයෙන් ඇති වන මතභේද වලදී ගනු ලබන ක්‍රියාමාර්ගය පිළිබඳ විධිවිධාන ඇතුලත් විය යුතුය. ඒ අනුව බේරුම් කිරීමේ බලධරයා කවරෙක්ද යන්න සඳහන් කළ යුතු අතර ඒ සඳහා 1995 අංක 11 දරණ බේරුම් කිරිමේ ආඥා පනතේ ඇති විධිවිධානයන් අදාල කර ගැනීම නීත්‍යානුකූල වන්නේය.

### 04.5.4 කුලී නියම කිරීම හා අය කිරීම

මීට අදාලව අනුගමනය කළ යුතු සම්මත කාර්ය පියවරයන් පහත දක්වා ඇත (Compliance Procedures)

i. කුලී හෝ ගාස්තු නියම කිරීම

*නෛතික යොමුව - ම.න.ස 155 හා 157, න.ස පනතේ 157 (11)(ක), ප්‍රා.ස පනතේ 126 (xii) (ක)*

අවශ්‍ය වන පරිදි කලින් කල පළාත් පාලන ආයතනය විසින් පොදු වෙළෙඳපලවල් වල ඇති කඩ කාමර, සාප්පු, කඩපිල්, මඩු, කොටු, තට්ටු පාවිච්චිය වෙනුවෙන් කුලී හෝ ගාස්තු අයකර ගැනීම සඳහා නිත්‍යානුකූල ප්‍රතිපාදන සැලසී ඇත. එකී නෛතික විධිවිධාන අනුව කුලී නියම කිරීම

අයකිරීම හා එවැනි කුලී හෝ යම් ගාස්තුවක් එකතු කිරීමට ඇති අයිතිය බඳු දීම යනාදී කාරණා විධිමත් කිරීම නිත්‍යානුකූල වන්නේය.

ii. සභා සම්මුතිය

*නෛතික යොමුව- ම.න.ස 21(1), න.ස පනතේ 26(2), ප්‍රා.ස පනතේ 14(1)*

පොදු වෙළඳපල කඩ කාමර කුලිය අතුරු ව්‍යවස්ථා පනවා ගැනීම මඟින් හෝ විධිමත් පරිදි තක්සේරු කිරීමෙන් පසු එය ක්‍රියාත්මක කිරීම සඳහා සභාව විසින් යෝජනා සම්මුතියක් ලබා ගත යුතුය.

iii. කුලිය අය කර ගැනීම

*නෛතික යොමුව - ම.න.ස 185(2) (ඈ), 253(1), 254(අ), 266(1), න.ස පනතේ 170(අ)(1), (2), ප්‍රා.ස 159(1),(2), ගිවිසුම් කොන්දේසි*

කුලියට දෙන ලද යම් ස්ථානයක කුලිය වශයෙන් අයවිය යුතු මුදල, ඒ මුදල අයවිය යුතුව තිබූ දින සිට දින 14 ක් ඇතුලත කුලිය නොගෙවුවහොත් බල ප්‍රදේශය ඇතුලත පිහිටි ඒ කුලී නිවැසියාට අයිති වූ සියලුම චංචල හා නිශ්චල දේපල තහනමට ගෙන විකිනීමෙන්ද කුලිය ලැබිය යුත්තේ යම් ස්ථානයක් වෙනුවෙන්ද ඒ ස්ථානයෙහි හෝ ඒ මත ඇති කවර හෝ තැනැත්තෙකුට අයත් සියලු චංචල දේපල තහනමට ගෙන විකිණීමෙන්ද ඒ හිඟ මුදල් අය කර ගැනීම සඳහා කටයුතු කල යුතුය. ලිඛිත නීතියේ ඇති විධිවිධාන ප්‍රකාරව අවශ්‍ය සියලු පියවර ගෙන හිඟ කුලී අයකර ගැනීම නාගරික කොමසාරිස් /සභා ලේකම් ගේ රාජකාරීමය වගකීමක් වේ.

iv. කුලී ආදායම් සහා අරමුදලට බැර කිරිම

*නෛතික යොමුව - ම.න.ස 185(2)(ඈ), න.ස පනතේ 158(1)(ඉ), ප්‍රා.ස 129(ඊ)*

පළාත් පාලන ආයතනය සතු කඩ කාමර බද්දට හෝ කුලියට දීම තුලින් උපචිත ආදායම් මුදල් සභාවේ පොදු අරමුදලට බැර කල යුතුය.

v. ප්‍රමාද ගාස්තු අය කිරීම

*නෛතික යොමුව - බදු ගිවිසුම් කොන්දේසි, පළාත් පාලන කොමසාරිස් ගේ චක්‍රලේඛ උපදෙස්*

කුලියට හෝ බද්දට දී ඇති වෙළෙඳපල කඩ කාමර වලින් අයවිය යුතු කුලිය/බද්ද ගිවිසුම් ප්‍රකාරව නියමිත දින හෝ ඊට පෙරාතුව නොගෙවන්නේ නම් ගිවිසුම් කොන්දේසි අනුව සහ පළාත් පාලන කොමසාරිස් විසින් නිකුත් කර ඇති චක්‍රලේඛ ප්‍රකාරව ප්‍රමාද දඩ මුදලක් අයකල යුතුව ඇත . සාමාන්‍යයෙන් කිසියම් මාසයක් සඳහා අයවිය යුතු කුලිය

අදාල මාසයේ 10 වෙනි දිනට පෙරාතුව නොගෙවුවහොත් මාසික කුලී මුදලින් 10% ක අධිගාස්තුවක් අය කිරීම කරනු ලැබේ.

vi. අතුරු බදු දීම

*නෛතික යොමුව - බදු ගිවිසුම් කොන්දේසි, පළාත් පාලන කොමසාරිස් ගේ චක්‍රලේඛ උපදෙස්*

සභාව සතු වෙළෙඳපල කඩ කාමරයක් තෝරාගත් යම් බදුකරුවෙකුට කුලියට හෝ බද්දට දීමේදී විධිමත් ලිඛිත ගිවිසුමකට එළඹෙනු ඇත. එකී ගිවිසුමේ එක් කොන්දේසියක් වන්නේ යථෝක්ත කඩ කාමරය අතුරු බදු දීම නොකළ යුතු බවය.

කිසියම් බදුකරුවෙකු හෝ කුලීකරුවෙකු ගිවිසුමේ කොන්දේසි වලට පටහැනිව කටයුතු කර ඇත්තේ නම් ගිවිසුම අවලංගු කර යථෝක්ත කඩ කාමරය නැවත ටෙන්ඩර් කිරීමෙ හෝ පළාත් පාලන කොමසාරිස් විසින් නිකුත් කර ඇති චක්‍ර ලේඛ උපදෙස් වලට අනුකූලව ක්‍රියා කල යුතුය.

## 04.6 තාවකාලික කඩ කුලී

බල ප්‍රදේශය කුල කාවකාලික කඩ වශයෙන් පවත්වාගෙන යන වෙළෙඳ කුටි වලින් දෛනික පදනමින් හෝ මාසික ගාස්තුවක් අය කිරීම තුලින් මෙම ආදායම් පළාත් පාලන ආයතන විසින් උපයාගනු ලැබේ.

මෙම ආදායම් ප්‍රභවයට අදාලව අවධානය යොමු කල යුතු ක්ෂේත්‍රයන් පහත දක්වා ඇත.

i. කුලිය/ගාස්තුව තීරණය කිරීම

ii. ගිවිසුමකට එළඹීම

iii. ගාස්තු එකතු කිරීම

### 04.6.1 කුලිය/ගාස්තුව තීරණය කිරීම

මීට අදාලව නෛතිකව අනුගමනය කළ යුතු කාර්ය පියවරයන් පහත දැක්වේ. (Compliance Procedures)

i. සභා සම්මුතිය

*නෛතික යොමුව - ම.න.සආඥා පනතේ 21(1), න.ස ආඥා පනතේ 26 (4), ප්‍රා.ස පනතේ 14(1)*

බල ප්‍රදේශය තුල පිහිටි තාවකාලික කඩ වලින් අයකරන ගාස්තු/කුලිය කොපමණද යන්න පිලිබඳව සභාව විසින් බහුතරයේ කැමැත්ත මත තීරණයක් ගත යුතුය.

ii. ගාස්තු ප්‍රකාශයට පත් කිරීම

***නෛතික යොමුව- අර්ථ නිරූපන ආඥා පනතේ 17(1)***

අයකරන ගාස්තුව තීරණය කිරීමෙන් අනතුරුව ජනතාවගේ දැන ගැනීම සඳහා ගැසට් නිවේදනයක් මඟින් එය ප්‍රසිද්ධියට පත් කිරීම නීත්‍යානුකූල අවශ්‍යතාවයක් වේ.

## 04.6.2 ගිවිසුමකට එළඹීම

මීට අදාලව නෛතිකව අනුගමනය කළ යුතු කාර්ය පියවරයන් පහත දැක්වේ. (Compliance Procedures)

i. ගිවිසුමකට එළඹීම

***නෛතික යොමුව- ම.න.සආඥා පනතේ 40(1)උ, 227,228, න.ස ආඥා පනතේ 36(ඊ), ප්‍රා.ස පනතේ 173 හා ගිවිසුම් නීතිය***

තාවකාලික කඩ වලින් කුලී නියම කර අය කිරීම සම්බන්ධයෙන් අදාල කුලිකරු/බදුකරු සමඟ ලිඛිත ගිවිසුමකට එළඹීම නීතිමය අවශ්‍යතාවයක් වේ. යථෝක්ත ගිවිසුමට පළාත් පාලන ආයතනය වෙනුවෙන් අත්සන් කිරීමේදී සභාවේ පොදු මුද්‍රාව තබා අත්සන් කළ යුතු අතර, ප්‍රාදේශීය සභාවක් වෙනුවෙන් සභාපති හා ලේකම් යන දෙදෙනාම ගිවිසුමට අත්සන් කළ යුතුය. එමෙන්ම මහා නගර සභා සම්බන්ධයෙන් ද ඒ ආකාරයෙන්ම කටයුතු කළ යුතු අතර, නගර සභාවන්ට අදාලව ගිවිසුමට අත්සන් කිරිමට නගර සභා සභාපතිවරයාට නෛතිකව බලය පවරා ඇත.

ii. ගිවිසුමේ අන්තර්ගතය

***නෛතික යොමුව - ගිවිසුමේ කොන්දේසි, 1995 අංක 11 දරන බේරුම් කිරීමේ පනතේ විධිවිධාන***

කිසියම් බදුදීමක් හෝ කුලියට දීමක් සිදුවන අවස්ථාවකදී අත්සන් කරනු ලබන බදු ගිවිසුමට අන්තර්ගත කොන්දේසි වලට කුලිය හෝ බද්දට දෙනු ලබන දේපල සම්බන්ධයෙන් ඇති වන මතභේද වලදී ගනු ලබන ක්‍රියාමාර්ගය පිළිබඳ විධිවිධාන ඇතුලත් විය යුතුය. ඒ අනුව බේරුම් කිරීමේ බලධරයා කවරෙක්ද යන්න සඳහන් කළ යුතු අතර ඒ සඳහා 1995 අංක 11 දරණ බේරුම් කිරිමේ ආඥා පනතේ ඇති විධිවිධානයන් අදාල කර ගැනීම නීත්‍යානුකූල වන්නේය.

## 04.6.3 ගාස්තු එකතු කිරීම

තාවකාලික කඩ කාමර/ වෙළෙ කුටි වලින් අය කරනු ලබන කුලිය /ගාස්තුව

එකතු කිරීමේදී නෛතිකව අනුගමනය කාර්ය පියවරයන් පහත දැක්වේ. (Compliance Procedures)

i. මාසිකව කුලී/ගාස්තු අය කිරීම

*නෛතික යොමුව - ගිවිසුමේ කොන්දේසි*

ගිවිසුම් කොන්දේසි වල අන්තර්ගත විධිවිධාන අනුව මාසික කුලිය යාවත්කාලීනව අයකර ගැනීම පළාත් පාලන ආයතනයේ කාර්යභාරයක් වන්නේය.

ii. ප්‍රමාද ගාස්තු අය කිරිම

*නෛතික යොමුව - ගිවිසුමේ කොන්දේසි*

ගිවිසුම් ප්‍රකාරව නියමිත දිනට කුලිය/ගාස්තු ගෙවීම පැහැර හරින්නන්ගේ මාසික කුලිය පදනම් කර ගෙන 10% ක මුදලක් ප්‍රමාද ගාස්තු වශයෙන් අය කර ගැනීමට ගිවිසුම් කොන්දේසි ප්‍රකාරව හැකියාව ඇත. තවද මාසික කුලිය තවදුරටත් ගෙවීම ප්‍රමාද කරන්නේ නම් ප්‍රමාද වන කාලය අනුව ප්‍රමාද ගාස්තු වැඩි කිරීමට අදාල විධිවිධානයන් ගිවිසුමට ඇතුලත් කිරීමට හැකියාව ඇත.

## 04.7 මස්කඩ වාර්ෂිකව බදු දීම

සභාව විසින් සාදනු ලබන මස් කඩවල වෙළෙඳාම් කරගෙන යාමේ අයිතිය බද්දට දීම එම මස් කඩ වලින් මාසිකව කුලියක් අයකර ගැනීම තුලින් මෙම ආදායම් මාර්ගය සැකසී ඇත.

මෙම ආදායම් ප්‍රභවයට අදාලව අවධානය යොමු කල යුතු ක්ෂේත්‍රයන් පහත දක්වා ඇත.

i. අවම ලංසුව තීරණය කිරීම

ii. ටෙන්ඩර් කැඳවීම

iii. ගිවිසුමකට එලඹීම

### 04.7.1 අවම ලංසුව තීරණය කිරීම

මීට අදාලව නෛතිකව අනුගමනය කළ යුතු කාර්ය පියවරයන් පහත දැක්වේ. (Compliance Procedures)

i. සභා සම්මුතිය

*නෛතික යොමුව -ම.න.සආඥා පනතේ 21(1), න.ස ආඥා පනතේ 26(4), ප්‍රා.ස පනතේ 14(1)*

වාර්ෂිකව ටෙන්ඩර් කරනු ලබන මස්/මාලු කඩවල අවම ලංසුව කොපමණද යන්න පිළිබඳව මහා සභාව විසින් තිරණය කල යුතු වේ. තීරණය කරනු ලබන අවම ලංසුව පදනම් කර ගෙන වාර්ෂිකව ටෙන්ඩර් කැඳවිය යුතුය

### 04.7.2 ටෙන්ඩර් කැඳවීම

මීට අදාලව නෛතිකව අනුගමනය කළ යුතු කාර්ය පියවරයන් පහත දැක්වේ. (Complianc Procedures)

i. ටෙන්ඩර් දැන්වීම සැකසීම

***නෛතික යොමුව- ම.න.සආඥා පනතේ 40(1) (ද) (සඩ), න.ස ආඥා පනතේ 129 ප්‍රා .ස පනතේ 108 සහ ටෙන්ඩර් පටිපාටියේ විධිවිධානයන්***

සභාව සතු මස්කඩ වාර්ෂිකව ටෙන්ඩර් කැඳවීමට අදාලව ටෙන්ඩර් දැන්වීම් කෙටුම්පත් කිරීම අවශ්‍ය වේ. ටෙන්ඩර් කිරීම සිදු කරනු ලබන වර්ෂයට පෙරාතුව එකී දැන්වීම් සිදු කල යුතු අතර ඒ පිළිබඳව අධීක්ෂණය නාගරික කොමසාරිස්/සභා ලේකම් වරයා විසින් සිදු කල යුතුව ඇත.

ii. ටෙන්ඩර් දැන්වීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

***නෛතික යොමුව - ම.න.සආඥා පනතේ 40(1) (ද) (සඩ), න.ස ආඥා පනතේ 129, ප්‍රා .ස පනතේ 108 සහ ටෙන්ඩර් පටිපාටියේ විධිවිධානයන්***

කෙටුම්පත් කල ටෙන්ඩර් දැන්වීම් මහා සභාවට ඉදිරිපත් කර සභා අනුමැතිය ලබා ගැනීම නිත්‍යානුකූල අවශ්‍යතාවයක් වේ.

i. ටෙන්ඩර් කැඳවීම

***නෛතික යොමුව - ම.න.සආඥා පනතේ 40(1) (ද) (සඩ), න.ස ආඥා පනතේ 129, ප්‍රා .ස පනතේ 108 සහ ටෙන්ඩර් පටිපාටියේ විධිවිධානයන්***

සභා සම්මුතියක් මගින් අවම ලංසුව නිගමනය කළ පසු අදාල මස් /මාලු විකිණීමේ අයිතිය වාර්ෂිකව බදු දීම සඳහා ටෙන්ඩර් කැඳවීම අවශ්‍ය වේ. මෙහිදී පිළිගත් ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කල යුතු අතර ලැබෙන ටෙන්ඩර් කමිටුවක් මගින් හෝ මහා සභාවේදී විවෘත කර සාර්ථක ටෙන්ඩර්කරු තෝරාගත යුතුය. මෙම ක්‍රියාවලිය කඩ කාමරයේ වෙළෙඳ අයිතිය ප්‍රදානය කිරීමට නියමිත වර්ෂයට පෙරාතුව සිදු කළ යුතුව ඇත.

ii. ගිවිසුමකට එළඹීම

***නෛතික යොමුව - ම.න.සආඥා පනතේ 40(1) (ද) (සඩ), න.ස ආඥා පනතේ 129, ප්‍රා .ස පනතේ 108 සහ ටෙන්ඩර් පටිපාටියේ විධිවිධානයන්***

තෝරාගත් බදුකරු සමග විධිමත් ලිඛිත ගිවිසුමකට එළඹිය යුතු වේ. එකඟ වූ ටෙන්ඩර් මුදල ගෙවිය යුතු නිශ්චිත දිනයන් හා ගෙවීම් ප්‍රමාද වූ අවස්ථාවලදී අය කරනු ලබන ප්‍රමාද ගාස්තු කොපමණද යන්න පිලිබඳ විධිවිධානයන් ගිවිසුම් කොන්දේසි වලට ඇතුලත් විය යුතුය. ඊට අමතරව ගිවිසුම අනුව කටයුතු කිරිමේදී කිසියම් මතභේදයක් උද්ගත වුවහොත් 1995 අංක 11 දරන බේරුම් කිරීමේ ආඥා පනතේ විධිවිධානයන් ද ගිවිසුම් කොන්දේසි වලට ඇතුල් කිරීම වඩාත් වැදගත් වේ

iii. මාසික කුලිය අය කිරීම

***නෛතික යොමුව - ම.න.සආඥා පනතේ 40(1) (ද) (සඩ), න.ස ආඥා පනතේ 129, ප්‍රා .ස පනතේ 108 සහ ටෙන්ඩර් පටිපාටියේ විධිවිධානයන්***

ගිවිසුම් ප්‍රකාරව සභාවට අයවිය යුතු මාසික කුලිය යාවත්කාලීනව අය කර ගැනීමට හා ඊට අදාල ලේඛන පවත්වාගෙන යාම පිලිබඳව අවශ්‍ය කටයුතු කිරීම පළාත් පාලන ආයතනයට ලැබිය යුතු ආදායම් සම්බන්ධයෙන් ව්‍යවස්ථාපිත වගකීම පැවරී ඇති නාගරික කොමසාරිස් / ලේකම් වරයා සතු කාර්යභාරයක්වේ.

## 04.8 දින පොළ/සති පොළ ගාස්තු

පළාත් පාලන ආයතන බල ප්‍රදේශයේ වාසය කරන හෝ එහි ගැවසෙන තැනැත්තන්ගේ යහපත සඳහා මහජනෝපකාර සේවාවක් ලෙස දින පොළ/සති පොළ පවත්වාගෙන යාමට මඟ නීතියෙන් පළාත් පාලන ආයතන වලට බලතල ලැබී ඇත.එම පොළවල් මගින් අය කරනු ලබන ගාස්තු ඇසුරින් මෙම ආදායම් පළාත් පාලන ආයතන වල ස්වයං උත්පාදන ආදායම් මාර්ගයක් බවට පත්වී ඇත.

**අවධානය යොමු කළ යුතු විෂය ක්ෂේත්‍රයන් (Attention Area)**

i. ගාස්තු අයකිරීම.
ii. ටෙන්ඩර් කැඳවීම.

### 04.8.1 ගාස්තු අයකිරීම.

මීට අදාලව නෛතිකව අනුගමනය කළ යුතු කාර්ය පියවරයන් පහත දැක්වේ. (Complianc Procedures)

i. පොළ ආදායම් අයකරගන්නා ආකාරය තීරනය කිරීම

***නෛතික යොමුව - ම.න.සආඥා පනතේ 185(2) 155 සිට 160 න.ස ආඥා පනතේ 129 148, ප්‍රා.ස පනතේ 129 108 119***

පොළ ගාස්තු/ආදායම් එකතු කිරීමේ කාර්ය ටෙන්ඩර් පදනම මත බාහිර

පාර්ශ්වයකට පවරන්නේද ? එසේ නොමැතිව පළාත් පාලන ආයතනයේ සේවකයින් මගින් සිදු කරන්නේද යන්න පිළිබඳව සභා යෝජනා සම්මුතියක් මගින් තීරනය කල යුතුවේ.

ii. අතුරු ව්‍යවස්ථා පැනවීම.

***නෛතික යොමුව - ම.න.ස ආඥා පනතේ 272(28) න.ස ආඥා පනතේ 157 (11), ප්‍රා.ස පනතේ 126(xii)***

සති පොළ/දින පොළ පිහිටුවීම නඩත්තු කිරීම වැඩි දියුණු කිරීම පාලනය හා පරිපාලනය උදෙසා පළාත් පාලන ආයතනය විසින් අතුරු ව්‍යවස්ථා විධිමත් පරිදි පනවා ගැනීම නීතිමය අවශ්‍යතාවයක් වේ.

## 04.8.2 ටෙන්ඩර් කැඳවීම

මීට අදාලව නෛතිකව අනුගමනය කළ යුතු කාර්ය පියවරයන් පහත දැක්වේ. (Compliance Procedures)

i. **ටෙන්ඩර් කැඳවීම**

***නෛතික යොමුව- ම.න.සආඥා පනතේ 40(1) (ද) (iv)***
***න.ස ආඥා පනතේ 129, ප්‍රා .ස පනතේ 108 සහ ටෙන්ඩර් පටිපාටියේ විධිවිධානයන්***

සභා සම්මුතියක් මගින් සති පොළ ගාස්තු එකතු කිරීමේ අයිතිය වාර්ෂිකව බදු දීම සඳහා ටෙන්ඩර් කැඳවීම අවශ්‍ය වේ. මෙහිදී පිළිගත් ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කල යුතු අතර ලැබෙන ටෙන්ඩර් කමිටුවක් මගින් හෝ මහා සභාවේදී විවෘත කර සාර්ථක ටෙන්ඩර්කරු තෝරාගත යුතුය. මෙම ක්‍රියාවලිය සති පොළ ගාස්තු එකතු කිරීමේ අයිතිය ප්‍රදානය කිරීමට නියමිත වර්ෂයට පෙරාතුව සිදු කළ යුතුව ඇත.

ii. **ගිවිසුමකට එළඹීම**

***නෛතික යොමුව- ම.න.සආඥා පනතේ 40(1) (ද) (iv)***
***න.ස ආඥා පනතේ 129, ප්‍රා.ස පනතේ 108 සහ ටෙන්ඩර් පටිපාටියේ විධිවිධානයන්***

තෝරාගත් බදුකරු සමඟ විධිමත් ලිඛිත ගිවිසුමකට එළඹිය යුතු වේ. එකඟ වූ ටෙන්ඩර් මුදල ගෙවිය යුතු නිශ්චිත දිනයන් හා ගෙවීම් ප්‍රමාද වූ අවස්ථාවලදී අය කරනු ලබන ප්‍රමාද ගාස්තු කොපමණද යන්න පිලිබඳ විධිවිධානයන් ගිවිසුම් කොන්දේසි වලට ඇතුලත් විය යුතුය. ඊට අමතරව ගිවිසුම අනුව කටයුතු කිරිමේදී කිසියම් මතභේදයක් උද්ගත වුවහොත් 1995 අංක 11 දරන බේරුම් කිරීමේ ආඥා පනතේ විධිවිධානයන් ද ගිවිසුම් කොන්දේසි වලට ඇතුල් කිරීම වඩාත් වැදගත් වේ.

iii. ගාස්තු අයකර ගැනීම

***නෛතික යොමුව- ම.න.සආඥා පනතේ 40(1) (ද) (iv)***
***න.ස ආඥා පනතේ 129, ප්‍රා .ස පනතේ 108 සහ ටෙන්ඩර් පටිපාටියේ විධිවිධානයන්***

ගිවිසුම් ප්‍රකාරව සභාවට අයවිය යුතු පොළ ගාස්තු යාවත්කාලීනව අය කර ගැනීමට හා ඊට අදාල ලේඛන පවත්වාගෙන යාම පිලිබඳව අවශ්‍ය කටයුතු කිරීම පළාත් පාලන ආයතනයට ලැබිය යුතු ආදායම් සම්බන්ධයෙන් ව්‍යවස්ථාපිත වගකීම පැවරී ඇති නාගරික කොමසාරිස් / ලේකම්වරයා සතු කාර්යභාරයක්වේ.

## 04.9 වාහන නැවතුම් ගාස්තු (Parking Charges)

පළාත් පාලන ආයතන බල ප්‍රදේශය තුල රථවාහන නවතා තැබීම පාලනය කිරීම සඳහා රථවාහන නැවතුම් ස්ථාන සකස් කොට ඒ තුලින් වාහන නැවතුම් ගාස්තු උපයා ගත හැකිය. මීට අදාලව අවධානය යොමුකළ යුතු විෂය ක්ෂෙත්‍රයන් හා කාර්ය පියවරයන් පහත දක්වා ඇත.

අවධානය යොමු කළ යුතු විෂය ක්ෂේත්‍රයන් ( Attention Area)

i. රථවාහන නැවතුම් ස්ථාන

ii. අතුරු ව්‍යවස්ථා පනවා ගැනීම

### 04.9.1 රථවාහන නැවතුම් ස්ථාන

මීට අදාලව නෛතිකව අනුගමනය කළ යුතු කාර්ය පියවරයන් පහත දැක්වේ. (Compliance Procedures)

i. වාහන නැවතුම් ස්ථාන ඇති කිරීම

***නෛතික යොමුව - ම.න.ස ආඥා පනතේ 272(32)***
***න.ස ආඥා පනතේ 157(14) (අ)***
***ප්‍රා.ස පනතේ 126 (vii) (ඌ)***

බල ප්‍රදේශය තුල මෝටර් වාහන නවත්වා තැබීම පාලනය කිරීම සඳහා සභාව විසින් රථවාහන නැවතුම් ස්ථාන ඇති කිරීමට පියවර ගත යුතුය. මේ සඳහා සභාව සතු ඉඩම් හෝ භූමි ප්‍රමාණයන් නොමැත්තේ නම් බාහිර පාර්ශ්වයකින් අවශ්‍ය ඉඩම් හෝ භූමි ප්‍රමාණයන් බද්දට ලබා ගෙන යථෝක්ත වාහන නැවතුම් ස්ථාන සඳහා එකී භූමි ප්‍රමාණයන් යෙදවීමට හැකියාව ඇත.

### 04.9.2 අතුරු ව්‍යවස්ථා

මීට අදාලව නෛතිකව අනුගමනය කළ යුතු කාර්ය පියවරයන් පහත දැක්වේ. (Compliance Procedures)

i. **අතුරු ව්‍යවස්ථා පනවා ගැනීම**

*නෛතික යොමුව - ම.න.ස ආඥා පනතේ 272(32), න.ස ආඥා පනතේ 157(14) (අ) ප්‍රා.ස පනතේ 126 (vii) (උ)*

වාහන නැවතුම් ස්ථාන විධිමත් කිරීම, හා පාලනය කිරිම උදෙසා සභාව විසින් අතුරු ව්‍යවස්ථා කෙටුම්පත් කර විධිමත් පරිදි පනවා ගැනීමට කටයුතු කල යුතුය

ii. **සභා සම්මුතිය ලබා ගැනීම**

*නෛතික යොමුව- ම.න.ස ආඥා පනතේ 21 (1), න.ස ආඥා පනතේ 26 (4), ප්‍රා. ස පනතේ 14(1)*

වාහන නැවතුම් ස්ථාන සඳහා කෙටුම්පත් කරන ලද අතුරු ව්‍යවස්ථා සභාවට ඉදිරිපත් කර බහුතරයේ එකඟතාවය මත සභා සම්මුතියක් ලබා ගත යුතුය.

iii. **අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීම**

*නෛතික යොමුව- ම.න.ස ආඥා පනතේ 268(1), න.ස ආඥා පනතේ 154(1), ප්‍රා. ස පනතේ 123(1)*

සභා සම්මත කරන ලද අතුරු ව්‍යවස්ථා විෂයභාර අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන තුරු සහ එකී අනුමැතිය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පලකරනු ලබනතුරු බලරහිත වේ. එබැවින් ඒ සඳහා අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීම නීත්‍යානුකුල අවශ්‍යතාවයක් වේ.

iv. **අතුරු ව්‍යවස්ථා ගැසට් පත්‍රය මඟින් ප්‍රසිද්ධ කිරීම**

*නෛතික යොමුව- අර්ථ කථනය පිළිබඳ ආඥා පනතේ 17(1)*
*ම.න.ස ආඥා පනතේ 268(1) න.ස ආඥා 154(1),ප්‍රා.ස පනතේ 123(1)*

සභාව විසින් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු එකී අතුරු ව්‍යවස්ථා ත්‍රෛභාෂිකව ගැසට් පත්‍රය මඟින් ප්‍රසිද්ධියට පත් කළ යුතුය.

මහා නගර සභා සම්බන්ධයෙන් වන කල්හි, යථෝක්ත අතුරු ව්‍යවස්ථා අමාත්‍යවරයාගේ අනුමැතිය ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව එය පළාත් සභාවේ එකඟතාවය ලබා ගෙන එකී එකඟතාවය

ද ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කරන තෙක් ඒ සඳහා නෛතික බලයක් හිමි නොවන්නේය.

## 04.10 බලපත්‍ර ගාස්තු (Trade Licence)

පළාත් පාලන ආයතන බල ප්‍රදේශය තුල කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාම සඳහා පළාත් පාලන ආයතනය විසින් බලපත්‍රයක් නිකුත් කිරීම මත මෙම ආදායම් ප්‍රභවය ජනිත වේ.විශේෂයෙන් පීඩාකාරී හෝ අන්තරාදායක යැයි පළාත් පාලන ආයතන විසින් සලකනු ලබන ව්‍යාපාර මීට ඇතුලත් වේ. ඒ අනුව මේ සම්බන්ධයෙන් අවධානය යොමු කල යුතු ක්ෂේත්‍රයන් හා කාර්ය පියවරයන් පහත දක්වා ඇත.

**අවධානය යොමු කළ යුතු විෂය ක්ෂේත්‍රයන් (Attention Area)**

i. අතුරු ව්‍යවස්ථා

ii. බලපත්‍ර ගාස්තු පැනවීම

iii. ගාස්තු අය කිරීම හා නෛතික ක්‍රියා මාර්ග ගැනීම

### 04.10.1 අතුරු ව්‍යවස්ථා

මීට අදාලව නෛතිකව අනුගමනය කළ යුතු කාර්ය පියවරයන් පහත දැක්වේ. (Compliance Procedures)

i. අතුරු ව්‍යවස්ථා පනවා ගැනීම

*__නෛතික යොමුව__ -ම.න.ස 247 අ(2), 272(15),*
*න.ස 164(1), 157(9) (ග),ප්‍රා.ස පනතේ 149,126(ix)( ඔ)*

කර්මාන්ත විධිමත් කිරීම, පාලනය කිරිම හා අධීක්ෂණය කිරීම සඳහා පළාත් පාලන ආයතන විසින් අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට හෝ සම්මත අතුරු ව්‍යවස්ථාවක් වැළඳ ගැනීම සිදු කළ යුතුය.

### 04.10.2 බලපත්‍ර ගාස්තු පැනවීම

මීට අදාලව නෛතිකව අනුගමනය කළ යුතු කාර්ය පියවරයන් පහත දැක්වේ. (Compliance Procedures)

i. **සභා සම්මුතියක් ගැනීම**

*නෛතික යොමුව- ම.න.ස ආඥා පනතේ 21(1),*
*න.ස ආඥා පනතේ, 26(2), ප්‍රා.ස පනතේ 14(1) හා මූල්‍ය*
*පරිපාලන රීති අංක 2 (1) (අ)*

කිසියම් කර්මාන්තයකට අදාලව අතුරු ව්‍යවස්ථාවක් යටතේ නිකුත්

කරනු ලැබූ බලපත්‍රයක් මත අයකල හැකි ගාස්තුව කොපමණද යන්න පිළිබඳව සභා තීරණයක් ගත යුතුය.

ii. **ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කිරීම**

***නෛතික යොමුව- අර්ථ කථනය පිළිබඳ ආඥා පනතේ 17(1)***

බලපත්‍ර ගාස්තුව පැනවීමට අදාලව වාර්ෂිකව යෝජනා සම්මතයක් මඟින් සභා තීරණ ගෙන එකී තීරණය ගැසට් පත්‍රය මඟින් ත්‍රෛභාෂිකව ප්‍රකාශයට පත් කළ යුතුය.

### 04.10.3 ගාස්තු අය කිරීම හා නෛතික ක්‍රියා මාර්ග ගැනීම

මීට අදාලව නෛතිකව අනුගමනය කළ යුතු කාර්ය පියවරයන් පහත දැක්වේ. (Compliance Procedures)

i. බලපත්‍ර ගාස්තු අය කර ගැනීම

***නෛතික යොමුව-ම.න.ස ආඥා පනතේ 309,***
***න.ස ආඥා පනතේ 219,ප්‍රා.ස පනතේ 213***

අතුරු ව්‍යවස්ථානුකූලව බලපත්‍රයක් ලබා ගත යුතු කර්මාන්ත අතුරින් කිසියම් කර්මාන්තයක් අතුරු ව්‍යවස්ථා උල්ලංඝනය කරමින් බලපත්‍රයක් රහිතව පවත්වාගෙන යන්නේ නම් එකී කර්මාන්තයට එරෙහිව නීතිමය පියවර ගත යුතුය.

### 04.11 කර්මාන්ත බදු (Trade Tax)

පළාත් පාලන ආයතන බල ප්‍රදේශය තුල පවත්වාගෙන යන කර්මාන්ත/ව්‍යාපාර අතුරින් අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍ර ගාස්තුවට යටත් නොවූ සහ ව්‍යාපාර බද්දට යටත් නොවන සියලුම කර්මාන්ත වලින් මෙම බද්ද අය කරනු ලැබේ. කර්මාන්ත බද්ද පැනවීම හා අය කිරීම ආශ්‍රිතව අවධානය යොමු කළ යුතු ක්ෂේත්‍ර හා කාර්ය පියවරයන් පහත දක්වා ඇත.

**අවධානය යොමු කළ යුතු විෂය ක්ෂේත්‍රයන් ( Attention Area)**

i. සභා සම්මුතිය

ii. බද්ද පැනවීම

iii. බදු ප්‍රමාණය නියම කිරීම

iv. ගාස්තු අය කිරීම හා නෛතික ක්‍රියාමාර්ග ගැනීම

### 04.11.1 සභා සම්මුතිය

මීට අදාලව නෛතිකව අනුගමනය කළ යුතු කාර්ය පියවරයන් පහත දැක්වේ. (Compliance Procedures)

i. **කර්මාන්ත බදු පැනවීම සඳහා සභා සම්මුතියක් ලබා ගැනීම**

*නෛතික යොමුව- ම.න.ස 247ආ(1)හා (2),*
*න.ස 165අ(1) (2), ප්‍රා.ස 150(1) හා (2)*

බල ප්‍රදේශය තුල වූ කර්මාන්ත/ව්‍යාපාර අතුරින් කර්මාන්ත බද්දට යටත් ව්‍යාපාර මොනවාද යන්න පිළිබඳව වාර්ෂිකව සභා තීරණයක් ගත යුතුය.

### 04.11.2 බද්ද පැනවීම

මීට අදාලව නෛතිකව අනුගමනය කළ යුතු කාර්ය පියවරයන් පහත දැක්වේ. (Complianc Procedures)

i. **වාර්ෂිකව බද්ද පැනවීම**

*නෛතික යොමුව- අර්ථ කථනය පිළිබඳ ආඥා පනතේ 17(1)*

වාර්ෂිකව සභා තීරණයක් මගින් මෙම කර්මාන්ත බදු පැනවිය යුතු අතර එකී පැනවීම ත්‍රෛභාෂිකව ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කළ යුතුය.

### 04.11.3 බදු ප්‍රමාණය නියම කිරීම

මීට අදාලව නෛතිකව අනුගමනය කළ යුතු කාර්ය පියවරයන් පහත දැක්වේ. (Compliance Procedures)

i. **ලිඛිත නීතියේ උපරිමයන්ට යටත්විය යුතු වීම**

*නෛතික යොමුව- .න.සආඥා පනතේ 247ආ(2),*
*න.ස ආඥා පනතේ 165අ ( 2),ප්‍රා.ස පනතේ 150(2)*

පළාත් පාලන ආයතන විසින් කර්මාන්ත බද්ද නියම කල යුත්තේ සංස්ථාපිත පනතේ ඇති උපරිමයන්ට යටත්වය. බද්ද ගණනය කිරීමට පදනම් කරගත යුත්තේ අදාල කර්මාන්තයේ වාර්ෂික වටිනාකම වේ.

### 04.11.4 ගාස්තු අය කිරීම හා නීතිමය ක්‍රියාමාර්ග

මීට අදාලව නෛතිකව අනුගමනය කළ යුතු කාර්ය පියවරයන් පහත දැක්වේ. (Compliance Procedures)

i. **හිඟ බදු අය කිරීම හා නීතිමය ක්‍රියාමාර්ග ගැනීම**

***නෛතික යොමුව- ම.න.ස ආඥා පනතේ 247ආ(4) , න.ස ආඥා පනතේ 165අ(4), ප්‍රා.ස පනතේ 150(4)***

බද්ද ගෙවීමට යටත් යම් තැනැත්තෙකුගෙන් එම බද්ද ඉල්ලා සිටීමෙන් පසුව, දින 7 ක් ඇතුලත ගෙවීම පැහැර හරින්නේ නම් ඒ පිළිබඳව නාගරික කොමසාරිස් /සභා ලේකම්වරයා විසින් අධිකරණයට වාර්තා කොට එකී බද්ද අය කර ගැනීමට කටයුතු කළ යුතුය.

## 04.12 ව්‍යාපාර බදු (Business Tax)

කර්මාන්ත බද්දට හෝ බලපත්‍ර ගාස්තු වලට යටත් නොවන්නාවූ පළාත් පාලන බල ප්‍රදේශය තුල පවත්වාගෙන යනු ලබන අනෙකුත් ව්‍යාපාර වලින් මෙම ව්‍යාපාර බද්ද අය කරනු ලැබේ. කෙසේ වුවද පවත්වාගෙන යනු ලබන කිසියම් ව්‍යාපාරයකින් අයකල හැක්කේ කර්මාන්ත බදු හෝ බලපත්‍ර ගාස්තු හෝ ව්‍යාපාර බදු හෝ යන බදු/ගාස්තු වලින් එක් වර්ගයක් පමණි.

**අවධානය යොමු කළ යුතු විෂය ක්ෂේත්‍රයන් ( Attention Area)**

i. ව්‍යාපාර බද්ද නියම කිරීම හා පැනවීම

ii. බදු අය කර ගැනීම

### 04.12.1 ව්‍යපාර බද්ද නියම කිරීම හෝ පැනවීම

මීට අදාලව නෛතිකව අනුගමනය කළ යුතු කාර්ය පියවරයන් පහත දැක්වේ. (Compliance Procedures)

i. **ව්‍යාපාර බද්ද පැනවීම සඳහා යෝජනා සම්මතයක් ලබාගැනීම**

***නෛතික යොමුව- ම.න.ස ආඥා පනතේ 247 ඇ***
***න.ස ආඥා පනතේ 165ආ, ප්‍රා.ස පනතේ 152***

පළාත් පාලන ආයතන බල සීමාව තුල පවත්වාගෙන යනු ලබන වෙළෙඳ ව්‍යාපාර අතුරින් ව්‍යාපාර බද්ද නියම කිරීම සඳහා සභා යෝජනා සම්මතයක් ලබා ගත යුතුය.

ii. **බද්ද ගණනය කිරීමේ පදනම**

***නෛතික යොමුව- ම.න.ස ආඥා පනතේ 247ඇ,***
***න.ස ආඥා පනතේ 165ආ, ප්‍රා.ස පනතේ 152 (1)***

බද්ද ගෙවිය යුතු වර්ෂයට පෙර වර්ෂය සඳහා වූ වෙළෙඳ ව්‍යාපාරයේ ආදායම අනුව සහ ප්‍රධාන නීතියේ (පළාත් පාලන ආයතන

සංස්ථාපනය කරන ලද) දැක්වෙන අනුප්‍රමාණයන් නොඉක්මවන්නාවූ අනු ප්‍රමාණයන්ට අනුකූලව මෙම බද්ද ගණනය කර අය කල හැකිය. කෙසේ වුවද අය කල හැකි උපරිම බදු සීමාව රු 3000/- කි.

ii. **බද්ද පැනවීම වාර්ෂිකව සිදු කිරීම**

***නෛතික යොමුව- අර්ථ නිරූපන පනතේ 17 (1), ම.න.ස ආඥා පනතේ 247 ඇ, න.ස ආඥා පනතේ 165ආ, ප්‍රා.ස පනතේ 152***

ව්‍යාපාර බද්ද වාර්ෂික බද්දක් වන අතර, බද්ද ගණනය කිරීම සඳහා පදනම් කරනුයේ ව්‍යාපාරයේ පෙර වර්ෂයේ ලැබීම් වේ. ඒ අනුව මෙම බද්ද යෝජනා සම්මුතියක් මඟින් වාර්ෂිකව පැනවිය යුතු අතර එකී පැනවීම ගැසට් පත්‍රය මඟින් ජනතාවගේ දැන ගැනීම සඳහා ප්‍රසිද්ධ කිරීම නිත්‍යානුකූල අවශ්‍යතාවයක් වේ.

### 04.12.2 බදු අය කර ගැනීම

මීට අදාලව නෛතිකව අනුගමනය කළ යුතු කාර්ය පියවරයන් පහත දැක්වේ. (Compliance Procedures)

i. **නියම කරන ලද බද්ද අප්‍රමාදව අය කර ගැනීම**

***නෛතික යොමුව- ම.න.ස ආඥා පනතේ 247 ආ(4)***
***න.ස ආඥා පනතේ 165ආ (3), ප්‍රා.ස පනතේ 152 (4)***

නියම කරන ලද බද්දක් යම් දිනයකදී ගෙවන ලෙස ඒ බද්ද ගෙවීමට යටත් තැනැත්තෙකුගෙන් ඉල්ලා සිටි විට, එසේ ඉල්ලා සිටි දිනය ඉකුත් වීමෙන් පසු දින 7 ක් ඇතුලතදී ගෙවීම නොකළ හොත්, එකී පැහැර හැරීම් පිළිබඳව නිතිමය පියවර ගෙන අදාල බදු මුදල අය කර ගැනීම නාගරික කොමසාරිස් /ලේකම් වරයාගේ රාජකාරිමය වගකීමක් වන්නේය.

### 04.13 ගලි සේවා ගාස්තු (Gully Service Charges)

පළාත් පාලන ආයතන ප්‍රදේශයන්හි පිහිටි වැසිකළි වල අපද්‍රව්‍ය ගලි බවුසරයක් මගින් ඉවත් කිරීමේ සේවාව වෙනුවෙන් අය කරන ගාස්තු මෙම ආදායම් ප්‍රභවයට අයත් වේ.

ගලි සේවා ගාස්තු නියම කිරිම, ගාස්තු පැනවීම හා අය කිරීමට අදාලව අවධානය යොමු කල යුතු ක්ෂේත්‍රයන් හා කාර්ය පියවරයන් පහත දැක්වේ.

**අවධානය යොමු කළ යුතු විෂය ක්ෂේත්‍රයන් ( Attention Area)**

i. සභා සම්මුතියකින් ගාස්තු නියම කිරීම

ii. අතුරු ව්‍යවස්ථා

iii. ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධියට පත් කිරීම

### 04.13.1 සභා සම්මුතියකින් ගාස්තු නියම කිරීම

මීට අදාලව නෛතිකව අනුගමනය කළ යුතු කාර්ය පියවරයන් පහත දැක්වේ. (Compliance Procedures)

i. **ගලි සේවා සැපයීමේ ගාස්තු නියම කිරීම**

*නෛතික යොමුව- ම.න.ස ආඥා පනතේ 21(1), 272(5)(අ)*
*න.ස ආඥා පනතේ 26(2), 130(ඈ),157(9)(ආ)*
*ප්‍රා.ස පනතේ 14(1), 109(ඈ),126(සං) (ආ)*

ගලි සේවා සැපයීම සඳහා වැය වන වියදම් ආවරණය කර ගැනීම සඳහා අයකල යුතු ගාස්තුව කොපමණද යන්න පිලිබඳව සභා යෝජනා සම්මුතියකට එළඹිය යුතුය.

### 04.13.2 අතුරු ව්‍යවස්ථා

මීට අදාලව නෛතිකව අනුගමනය කළ යුතු කාර්ය පියවරයන් පහත දැක්වේ. (Compliance Procedures)

ii. **අතුරු ව්‍යවස්ථා පනවා ගැනීම**

*නෛතික යොමුව- ම.න.ස ආඥා පනතේ 272(5)(ආ)*
*න.ස ආඥා 157(9)(ආ), ප්‍රා.ස පනතේ 126(ix) (ආ)*

මල මූත්‍ර ඉවත් කිරීම සහ බැහැරලීම හා ගාස්තු අයකිරීම, එම ක්‍රියාවලිය විධිමත් කිරීම පාලනය කිරීම හා අධීක්ෂණය කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා සම්පාදනය කළ යුතුය.

### 04.13.3 ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධියට පත් කිරීම

මීට අදාලව නෛතිකව අනුගමනය කළ යුතු කාර්ය පියවරයන් පහත දැක්වේ. (Compliance Procedures)

i. **ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කිරීම**

*නෛතික යොමුව- අර්ථ නිරූපන ආඥා පනතේ 17(1)*

සභා සම්මුතියක් මත අය කිරීමට තීරණය කරන ලද ගාස්තු හා ඊට අදාල අතුරු ව්‍යවස්ථා ජනතාවගේ දැන ගැනීම සඳහා ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කිරීම නීත්‍යානුකූල අවශ්‍යතාවයකි.

## 04.14 ආදාහනාගාර ගාස්තු (Crematorium Charge)

පළාත් පාලන ආයතන වලට පැවරී ඇති කාර්ය භාරයන් අතුරින් වැදගත් කාර්යභාරයක් වන්නේ පොදු උපයෝගිතා සේවාවන් සැපයීම වේ. ඒ අනුව වඩාත් වැදගත් පොදු උපයෝගිතා සේවාවක් ලෙස ආදාහනාගාර පවත්වාගෙන යාම තුලින් ආදාහනාගාර ගාස්තු අය කිරීමට පළාත් පාලන ආයතන වලට ප්‍රධාන නීතියෙන් අවසර ලබා දී ඇත.

ආදාහනාගාර පවත්වාගෙන යාම ගාස්තු අය කිරීම හා ආශ්‍රිත අභ්‍යන්තර පාලනය සඳහා අවධානය යොමු කර යුතු ක්ෂේත්‍රයන් හා අනුගමනය කල යුතු සම්මත කාර්ය පියවරයන් පහත දැක්වේ.

**අවධානය යොමු කළ යුතු විෂය ක්ෂේත්‍රයන් (Attention Area)**

i. යෝජනා සම්මතයක් මගින් ගාස්තු නියම කිරීම

ii. අතුරු ව්‍යවස්ථාගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කිරීම

### 04.14.1 යෝජනා සම්මතයක් මගින් ගාස්තු නියම කිරීම

මීට අදාලව නෛතිකව අනුගමනය කළ යුතු කාර්ය පියවරයන් පහත දැක්වේ. (Compliance Procedures)

i. **සභා සම්මුතිය**

*නෛතික යොමුව- ම.න.ස ආඥා පනතේ 21(1), න.ස ආඥා 26(2) ප්‍රා.ස පනතේ 14(1)*

පොදු උපයෝගිතා සේවාවක් ලෙස ආදාහනාගාර සේවාවක් පවත්වාගෙන යාම හා ඒ සඳහා වැයවන වියදම් ආවරණය කර ගැනීම උදෙසා සාධාරණ ගාස්තුවක් අය කිරීමට පළාත් පාලන ආයතනයට හැකියාව ඇත. මේ සඳහා යෝජනා ස්වීරත්වයෙන් සභා සම්මුතියක් ගැනීම නෛතික අවශ්‍යතාවයක් වේ.

### 04.14.2 අතුරු ව්‍යවස්ථා

මීට අදාලව නෛතිකව අනුගමනය කළ යුතු කාර්ය පියවරයන් පහත දැක්වේ. (Compliance Procedures)

i. **අතුරු ව්‍යවස්ථා පනවා ගැනීම**

*නෛතික යොමුව- ම.න.ස 272(28), 268(1)*
*න.ස ආඥා 157(13 ),154(1), ප්‍රා.ස පනතේ 126 (**xiv**) 123(1)*

මෘතදේහ ආදාහනය සඳහා පළාත් පාලන ආයතන විසින් පවත්වාගෙන යන ආදාහනාගාර සේවාව විධිමත් කිරීම, පාලනය

කිරීම හා අධීක්ෂණය කිරීමත්, ගාස්තු අය කිරීමත් සඳහා පළාත් පාලන ආයතන විසින් අතුරු ව්‍යවස්ථා පනවා ගත යුතුය. එසේ පනවා ගන්නා අතුරු ව්‍යවස්ථා බල සහිතවීමට විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගත යුතු අතර, පළාත් සභාවේ එකඟතාවය ලබා ගැනීමටද නීත්‍යානුකූල අවශ්‍යතාවයක් වන්නේය.

## 04.15 ජලය විකිණීම - ( Sale of Water)

පළාත් පාලන ආයතනයක් විසින් ස්වාධීනව හෝ වෙනයම් පළාත් පාලන ආයතනයක යම් තැනැත්තෙකු සමඟ සම්බන්ධව එම ප්‍රදේශයේ වාසය කරන හෝ එහි පදිංචියට යන තැනැත්තන් ගේ යහපත සඳහා පොදු උපයෝගිතා සේවාවන් අතුරින් ජල සම්පාදන සේවාවක් පිහිටුවා පවත්වාගෙන යාම තුලින්, එකී සේවාවෙන් ප්‍රයෝජනය ලබන තැනැත්තන් ගෙන් ගාස්තුවක් අය කිරීම මත මෙම ආදායම් උත්පාදනය කර ගැනීමට හැකියාව ඇත.

එකී සේවාව පවත්වාගෙන යාමේදී අවධානය යොමු කල යුතු ක්ෂේත්‍රයන් හා සම්මත කාර්ය පටිපාටීන් පහත දක්වා ඇත.

**අවධානය යොමු කළ යුතු විෂය ක්ෂේත්‍රයන් (Attention Area)**

i. සේවාව සැපයීම සඳහා සභා සම්මුතිය ගැනීම හා ජල ගාස්තු තීරණය කිරීම

ii. අතුරු ව්‍යවස්ථා

iii. ගිවිසුම්

### 04.15.1 සේවාව සැපයීම සඳහා සභා සම්මුතිය ගැනීම හා ජල ගාස්තු තීරණය කිරීම

මීට අදාලව නෛතිකව අනුගමනය කළ යුතු කාර්ය පියවරයන් පහත දැක්වේ. (Complianc Procedures)

i. **සභා සම්මුතියක් අනුව ගාස්තු නියම කිරීම**

***නෛතික යොමුව- ම.න.ස ආඥා පනතේ 185(1), (ඈ) සහ 21(1) න.ස ආඥා පනතේ 129(අ), 26(2), ප්‍රා.ස 108(අ), 14(1)***

පොදු උපයෝගිතා සේවාවක් ලෙස ජනතාවට ජල සම්පාදන සේවාවන් පවත්වාගෙන යාමට පළාත් පාලන ආයතන වලට නෛතිකව බලය ලබා දී ඇත. ඒ අනුව එවැනි සේවාවක් පවත්වාගෙන යාම සඳහා සභා සම්මුතියක් ගැනීම නීතිමය අවශ්‍යතාවයක් වේ.

ii. ගාස්තු නියම කිරීම

*නෛතික යොමුව - ම.න.ස ආඥා පනතේ 185(1), (ඈ)*
*න.ස ආඥා පනතේ 130(ආ)(ඈ), ප්‍රා.ස 109 (ඈ)*

සේවාව සැපයීම සඳහා සහා සම්මුතියක් ගැනීමෙන් අනතුරුව එකී සේවාවෙන් ප්‍රයෝජනය ලබන තැනැත්තන්ගෙන් අයකරන ගාස්තුව කොපමණද යන්න ගැන පළාත් පාලන ආයතනය තීරණය කල යුතුය.

### 04.15.2 අතුරු ව්‍යවස්ථා

මීට අදාලව නෛතිකව අනුගමනය කළ යුතු කාර්ය පියවරයන් පහත දැක්වේ. (Compliance Procedures)

i. අතුරු ව්‍යවස්ථා සම්පාදනය

*නෛතික යොමුව- ම.න.ස 272(28), 272(4) (උ), (ඌ)*
*න.ස ආඥා 157(12), ප්‍රා.ස පනතේ 126 (**xiii**)*

පොදු උපයෝගිතා සේවාවක් ලෙස ජල සම්පාදන සේවය පවත්වාගෙන යාම විධිමත් කිරීම, පාලනය කිරීම, අධීක්ෂණය කිරීම හා ගාස්තු අය කිරීම උදෙසා අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ගැනීම නිතිමය අවශ්‍යතාවයකි.

ii. අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීම

*නෛතික යොමුව - ම.න.ස 268(1), න.ස ආඥා 154(1)*
*ප්‍රා.ස පනතේ 122(1)*

කෙටුම්පත් කරන ලද අතුරු ව්‍යවස්ථා විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන ප්‍රකාශයට පත් කරන තෙක් එය වලංගු නොවන්නේය. එසේම ඒ සඳහා පළාත් සභාවේ එකඟතාවයද ලබා ගත යුතුය

iii. ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කිරීම

*නෛතික යොමුව - අර්ථ නිරූපන ආඥා පනතේ 17(1)*

විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව යථෝක්ත අතුරු ව්‍යවස්ථා ත්‍රෛභාෂිකව ගැසට් පත්‍රයේ පළ කල යුතු අතර, එසේ පළ කරන තෙක් ඒ සඳහා නීතිමය බලයක් නොලැබෙනු ඇත.

### 04.15.3 ගිවිසුම

මීට අදාලව නෛතිකව අනුගමනය කළ යුතු කාර්ය පියවරයන් පහත දැක්වේ. (Compliance Procedures)

i. **සේවා ගිවිසුමකට ඇතුලත් වීම**

***නෛතික යොමුව- ම.න.ස 227, න.ස ආඥා පනතේ 130(1) (ඇ) සහ 38, ප්‍රා.ස පනතේ 173***

ජල සේවා ලබා ගන්නා තැනැත්තා සමග පළාත් පාලන ආයතනය ගිවිසුමකට එළඹිය යුතුය. මහා නගර සභා සම්න්ධයෙන් වූ කලී නාගරික කොමසාරිස් වරයාද, නගර සභාවක් සම්බන්ධයෙන් සභාපතිවරයා විසින්ද, ප්‍රාදේශීය සභා සම්බන්ධයෙන් සභාපති හා ලේකම් යන දෙදෙනාද, පළාත් පාලන ආයතනය වෙනුවෙන් පොදු මුද්‍රාව තබා ගිවිසුමකට අත්සන් කිරීම නිතිමය අවශ්‍යතාවයක් වන්නේය.

## 04.16 වාහන හා සත්ව බදු - (Taxes on vehicles and animals)

පළාත් පාලන ආයතන බල ප්‍රදේශය තුල ඇති හෝ පාවිච්චි කරනු ලබන්නාවූ ප්‍රධාන නීතියේ (MCO, UCO, PS Act) හඳුන්වා දී ඇති උපලේඛන වල සඳහන් වූ වාහන හා සතුන් වෙනුවෙන් බද්දක් අයකිරීම තුලින් මෙම ආදායම් ප්‍රභවය පළාත් පාලන ආයතන වල සමස්ථ ආදායමට දායකවේ.

වාහන හා සත්ව බදු අයකිරීම හා ඒ ආශ්‍රිත සම්මත ක්‍රියාපටිපාටි අනුගමනය කිරීමේදී අවධානය යොමුකල යුතු ක්ෂේත්‍රයන් හා සම්මත කාර්ය පියවරයන් පහත දක්වා ඇත.

### 04.16.1 බද්ද පැනවීම හා අයකර ගැනීම.

මීට අදාලව නෛතිකව අනුගමනය කළ යුතු කාර්ය පියවරයන් පහත දැක්වේ. (Compliance Procedures)

අවධානය යොමු කළ යුතු විෂය ක්ෂේත්‍රයන් ( **Attention Area**)

i. **සභාවේ යෝජනා සම්මුතියක් ලබා ගැනීම**

***නෛතික යොමුව - ම.න.ස ආඥා පනතේ හතරවන උප ලේඛණය න.ස ආඥා පනතේ 26(2), ප්‍රා.ස 14 (1)***

පළාත් පාලන ආයතනය විසින් මෙම බද්ද පැනවීම සඳහා සභා විසින් යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මුතියක් ලබා ගැනීම අවශ්‍ය වේ.

ii. **වාර්ෂිකව බද්ද පැනවීම.**

***නෛතික යොමුව - ම.න.ස ආඥා පනතේ 245(1), න.ස ආඥා පනතේ 163(1), ප්‍රා.ස. පනතේ 148(1) හා මූල්‍ය හා පරිපාලන රීති 50-58, අර්ථ නිරූපන ආඥා පනතේ 17(1)***

මෙම බද්ද පළාත් පාලන ආයතන විසින් වාර්ෂිකව පැනවිය යුතු බද්දක් වන අතර,එම පැනවීම වාර්ෂිකව ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කිරීමද නීතිමය අවශ්‍යතාවයකි.

iii. **ගාස්තු උපරිමය**

***නෛතික යොමුව- ම.න.ස ආඥා පනතේ හතරවන උප ලේඛණය, ප්‍රා.ස. පනතේ හතරවන උප ලේඛණය.***

වාහන හා සත්ව බද්ද අයකිරීමේදී හා පැනවීමේ දී ප්‍රධාන නීතියේ සඳහන් බදු උපරිම සීමාවන් නොඉක්මවන බවට වගබලා ගැනීම වැදගත්වේ.

iv. **අයිතිය වෙනස් වීමේදී බදු අය කිරීමේ සීමාවන්**

***නෛතික යොමුව- ම.න.ස ආඥා පනතේ 246(2) න.ස ආඥා පනතේ 162(2), ප්‍රා.ස පනතේ 148(5)***

බද්දට යටත් වාහනයක් හෝ සතෙකුගේ අයිතිය පවරන ලද වර්ෂය වෙනුවෙන් බද්ද එවකට ගෙවා ඇත්තේ නම්, අයිතිය පවරනු ලැබීමේ හේතුවෙන් කිසිම තැනැත්තෙකු බද්දට යටත් නොවිය යුතුය.

## 4.17 සංවර්ධනය නොකළ ඉඩම් මත බදු (Tax on un-developed land)

පළාත් පාලන ආයතන බල ප්‍රදේශය තුළ පිහිටි යම් ඉඩමක් ගොඩනැගිලි ඉදි කිරීම සඳහා සුදුසු වන විටෙක හෝ ස්ථාවර නැතහොත් නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු වන විටෙක හෝ පළාත් පාලන ආයතනයේ මතය අනුව සාධාරණයැයි සැලකෙන වියදමකින් ඒ ඉඩම එකී යම් කාර්යයක් සඳහා සංවර්ධනය කළ හැකි වුවද එසේ නොකර පැහැර හැර ඇති ඉඩම් සංවර්ධනය නොකල ඉඩම් සේ සලකනු ලැබේ. එවැනි ඉඩම් වල ප්‍රාග්ධන බිම් අගය මත අය කරන බද්දක් තුලින් මෙම ආදායම් උත්පාදනය වේ.

මෙම බද්ද පළාත් පාලන ආයතන සංස්ථාපිත අණපනත් අනුව අනිවාර්යෙන් වාර්ෂිකව පැනවිය යුතු බද්දක් ලෙස නියම කර ඇත.

**අවධානය යොමු කළ යුතු විෂය ක්ෂේත්‍රයන් ( Attention Area)**

i. බද්ද පැනවීම

ii. අය කර ගැනීම

### 4.17.1 බද්ද පැනවීම

මීට අදාලව නෛතිකව අනුගමනය කළ යුතු කාර්ය පියවරයන් පහත දැක්වේ. (Compliance Procedures)

i. **සමීක්ෂණ පැවැත්වීම**

***නෛතික යොමුව- ම.න.ස ආඥා පනතේ 247 ඇ***
***න.ස ආඥා පනතේ 165 ඇ, ප්‍රා.ස 153***

බල ප්‍රදේශය තුල පවත්නා සංවර්ධනය නොකළ ඉඩම් යටතට ගැනෙන ඉඩම් කවරේද යන්න පිළිබඳව සභාවේ ආදායම් පරීක්ෂක/පරිපාලක හෝ සභාව විසින් පත් කරන ලද කමිටුවක් මඟින් සමීක්ෂණයක් කල යුතුවේ. එමෙන්ම එකී සමීක්ෂණයේදී ඉඩමේ අයිතිකරු, ඉඩම් ප්‍රමාණය හා ඔප්පු අංකය යනාදී විස්තර ලබා ගැනීම අවශ්‍ය වේ. ඉන් අනතුරුව හඳුනාගත් ඉඩම් වල ප්‍රාග්ධන වටිනාකම තක්සේරු කරවා ගත යුතු අතර මෙහිදී මඟ නීතියේ දැක්වෙන පහත සඳහන් අතුරු විධානයන් කෙරෙහිද සැලකිලිමත් විය යුතුය.

- ම.න.ස ආඥා පනත- 247 ඇ වගන්තියේ (2) වන උප වගන්තියේ අතුරු විධානය
- න.ස ආඥා පනත - 165 ඇ වන වගන්තියේ (2) වන උප වගන්තියේ අතුරු විධානය
- ප්‍රා.ස පනත - 153 වන වගන්තියේ (2) වන උප වගන්තියේ අතුරු විධානය

සමීක්ෂනයක් මඟින් ඉහත දත්ත තොරතුරු ඇතුලත් වාර්තාවක් සකසා මහා සභාවට ඉදිරිපත් කිරීම පළාත් පාලන ආයතනයේ ප්‍රධාන පරිපාලක නිලධාරියාගේ වගකීමක් වන්නේය.

ii. **සභා සම්මතය**

***නෛතික යොමුව- ම.න.ස ආඥා පනතේ 21(1)***
***න.ස ආඥා පනතේ 26 (4), ප්‍රා.ස. පනතේ 14 (1)***

බල ප්‍රදේශය තුල ඇති සංවර්ධනය නොකළ ඉඩම් මත අයකල යුතු බදුඅනුප්‍රමාණය කොපමණද යන්න පිළිබඳව යෝජනා සම්මුතියක් ගත යුතු වේ. එමෙන්ම මෙම සභා සම්මුතිය සෑම වර්ෂයක් සඳහාම ලබාගත යුතු අතර බද්ද පැනවීමද වාර්ෂිකව සිදු කිරීමට නිත්‍යානුකූල අවශ්‍යතාවයක් වේ.

iii. ගැසට් නිවේදන

*නෛතික යොමුව - අර්ථකථනය පිළිබඳ ආඥා පනතේ 17(1)*

සභාව විසින් වාර්ෂිකව බද්ද පැනවීමට අදාලව ගනු ලැබූ සභා සම්මුතිය ඇතුලත් වූ ගැසට් නිවේදනයක් ජනතාවගේ දැන ගැනීම සඳහා ත්‍රෛභාෂිකව ගැසට් පත්‍රය මඟින් ප්‍රසිද්ධ කල යුතු වේ. එය අර්ථ කථනය පිළිබඳ ආඥා පනතේ 17(1) වගන්තිය ප්‍රකාරව ඉටුකල යුතු නීත්‍යානුකූල අවශ්‍යතාවයක් වේ.

### 4.17.2 අය කර ගැනීම

සභාව විසින් සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීමෙන් අනතුරුව අදාල බද්ද ගෙවිය යුතු අවසන් දිනය සඳහන් කරමින් බද්දට යටත් තැනැත්තා වෙත පළාත් පාලන ආයතන විසින් දැනවීමක් යවා බද්ද අයකර ගැනීමට ක්‍රියා කළ යුතුය. ඊට අතිරේකව ක්ෂේත්‍රයට ගොස් ආදායම් පරීක්ෂක/පරිපාලක මඟින් හෝ ජංගම සේවා පැවැත්වීම මඟින් අදාල බදු මුදල් අයකර ගැනීමට හැකියාව ඇත.

## 4.18. ඇතැම් ඉඩම් විකිණීම මත බදු (Tax on certain sales of land)

මෙම බද්ද පළාත් පාලන ආයතන වලට අදාල මූලික නීතියෙන්ම පනවා ඇති බැවින් පළාත් පාලන ආයතන විසින් මෙම බද්ද පැනවීමේ අවශ්‍යතාවයක් නැත.

පළාත් පාලන ආයතන බල සීමාවන් ඇතුලත වූ යම් ඉඩමක් වෙන්දේසිකරුවකු හෝ තැරැව්කරුවෙකු හෝ ඔහුගේ සේවකයා හෝ අනියෝජිතයා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයකින් විකුණනු ලබන අවස්ථාවකදී අදාල විකුණුම්කරුගෙන් ඉඩම විකුණූ වටිනාකමින් 1%කට සමාන බද්දක් අය කිරීම තුලින් මෙම ආදායම් මාර්ගය සැකසී ඇත.

**මේ සම්බන්ධයෙන් අවධානය යෙමුකල යුතු විෂය ක්ෂේත්‍ර( Attention Area)**

i. විකුණන ඉඩම් හඳුනා ගැනීම

ii. විකුණන ඉඩම් මත බද්ද අය කර ගැනීම

### 4.18.1 විකුණන ඉඩම් හඳුනා ගැනීම

මීට අදාලව නෛතිකව අනුගමනය කළ යුතු කාර්ය පියවරයන් පහත දැක්වේ. (Compliance Procedures)

i. ඉඩම් වෙන්දේසි කෙරෙන දැන්වීම්

***නෛතික යොමුව- ම.න.ස ආඥා පනතේ 247 ඉ***
***න.ස ආඥා පනතේ 165 ඇ, ප්‍රා.ස 154***

බල ප්‍රදේශය තුල ඉඩම් වෙන්දේසි කෙරෙන බවට ප්‍රසිද්ධ කර දැන්වීම් පිළිබඳ සොයා බැලීම තුලින් ඉඩම් විකුණන වෙන්දේසිකරුවන් හෝ බ්‍රෝකර්වරුන් සහ ඊට අදාල ඉඩම් මොනවාද යන්න හඳුනාගත හැකිය

ii. ප්‍රචාරක දැන්වීම් අවසර පත්‍ර

***නෛතික යොමුව- ම.න.ස ආඥා පනතේ 247 ඉ***
***න.ස ආඥා පනතේ 165 ඇ, ප්‍රා.ස 154***

ප්‍රචාරක දැන්වීම් අවසර පත්‍ර මඟින්ද බල ප්‍රදේශය තුල ඉඩම් විකිනීම පිළිබඳ විස්තර අනාවරණය කර ගත හැකිය. ප්‍රචාරක දැන්වීම සඳහා පළාත් පාලන ආයතනය වෙත ලැබෙන ඉල්ලුම් පත්‍ර මගින් ඉඩම් විකිණීම හා ඊට අදාල වෙන්දේසිකරුවන් හා බ්‍රෝකර්වරුන් පිළිබඳ තොරතුරු ලබා ගත හැකි වේ.

iii. ඉඩම් කට්ටි කිරීම් අයදුම්පත්

***නෛතික යොමුව- ම.න.ස ආඥා පනතේ 247 ඉ***
***න.ස ආඥා පනතේ 165 ඇ, ප්‍රා.ස 154***

බල ප්‍රදේශය තුල කිසියම් ඉඩමක් කට්ටි කිරීමේදි අදාල පළාත් පාලන ආයතනයෙන් කට්ටි සැලැස්ම අනුමත කරවා ගත යුතු වේ. එම ඉඩම් කට්ටි සැලැසුම් හා අයදුම් ආශ්‍රයෙන්ද බල ප්‍රදේශය තුල සිදු කෙරෙන ඉඩම් විකිණීම පිළිබඳ තොරතුරු අනාවරණය කර ගත හැකිවේ.

### 4.18.2 විකුණන ඉඩම මත බද්ද අය කර ගැනීම

මීට අදාලව නෛතිකව අනුගමනය කළ යුතු කාර්ය පියවරයන් පහත දැක්වේ. (Compliance Procedures)

**ඉඩම් හුවමාරුව පිළිබඳ තොරතුරු උපුටාගැනීම**

***නෛතික යොමුව- ම.න.ස ආඥා පනතේ 247 ඉ***
***න.ස ආඥා පනතේ 165 ඇ, ප්‍රා.ස 154(1),154(2),අතුරු ව්‍යවස්ථා***

ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් මුද්දර ගාස්තු පිළිබඳ අදාල තොරතුරු හා විස්තර ලබා ගැනීමේදී බල ප්‍රදේශය තුල ඉඩම් විකිණීම පිළිබඳව හෝ ඉඩම් හුවමාරු වීම් පිළිබඳ තොරතුරු උපුටා ගැනීමට හැකියාව ඇත.

i. විකුණුම්කරු වෙත දැන්වීමක් යැවීම

*නෛතික යොමුව- ම.න.ස ආඥා පනතේ 247 ඉ*
*න.ස ආඥා පනතේ 165 ඇ, ප්‍රා.ස 154(1),154(2),අතුරු ව්‍යවස්ථා*

ඉඩම් විකුණුම් තොරතුරු අනාවරණය කර ගත් පසුව විකුණන ලද ඉඩමේ වටිනාකමින් 1% ක බද්දක් ගෙවන ලෙසට අදාල වෙන්දේසිකරු හෝ බ්‍රෝකර් වෙත ලිඛිත නිවේදනයක් යැවීම අවශ්‍ය වේ.

ii. ගෙවීම් පැහැර හැරි විට විධිමත් ක්‍රියාමාර්ග ගැනීම

*නෛතික යොමුව- ම.න.ස ආඥා පනතේ 247 ඉ*
*න.ස ආඥා පනතේ 165 ඇ, ප්‍රා.ස 154(1),154(2),අතුරු ව්‍යවස්ථා*

ගෙවිය යුතු බද්ද ඉල්ලමින් අදාල වෙන්දේසිකරු වෙත හෝ බ්‍රෝකර් වෙත ලිඛිත දැන්වීමක් යැවීමෙන් අනතුරුව දින 14 ක් ඇතුලත එකී බද්ද නොගෙවන්නේ නම් නෛතික පියවර ගත යුතු වේ. ඒ අනුව ගෙවීම් පැහැර හැරීම පිළිබඳ බල ප්‍රදේශයේ අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත් අධිකරණය වෙත වාර්තා කර අදාල බද්ද අයකර ගැනීමට කටයුතු කිරීම පළාත් පාලන ආයතනයේ නාගරික කොමසාරිස්/ලේකම් වරයාගේ රාජකාරිමය වගකීමක් වන්නේය.

## 4.19. ක්‍රීඩාපිටි/නගර ශාලා/ප්‍රජාශාලා කුලී ආදායම්

පළාත් පාලන ආයතනය විසින් ඇති කර පවත්වාගෙන යනු ලබන ක්‍රීඩා පිට්ටනි, නගර ශාලා හා ප්‍රජා ශාලා කුලියට දීම තුලින් මෙම ආදායම් මාර්ගය සැකසී ඇත.

**මේ සම්බන්ධයෙන් අවධානය යොමුකල යුතු විෂය ක්ෂේත්‍ර (Attention Area)**

i. ගාස්තු තීරණය කිරීම

ii. ගාස්තු අය කර ගැනීම

### 4.19.1 ගාස්තු තීරණය කිරීම

මීට අදාලව නෛතිකව අනුගමනය කළ යුතු කාර්ය පියවරයන් පහත දැක්වේ. (Compliance Procedures)

i. සභා සම්මුතිය

*නෛතික යොමුව- ම.න.ස ආඥා පනත 21(1),185(2)*
*න.ස ආඥා පනතේ 26(4), 158(2), ප්‍රා.ස 14 (1), 129(2) අතුරු ව්‍යවස්ථා*

සභාව සතු ක්‍රීඩා පිටිය, නගර ශාලාව හා ප්‍රජා ශාලාව කුලියට දීමේදී දිනකට හෝ අයකර ගාස්තුව කොපමණද යන්න පිළිබඳව ප්‍රථමයෙන්ම

සභාව විසින් යෝජනා සම්මුතියක් මගින් බහුතරයේ එකඟතාවය මත තීරණය කල යුතුය.

ii. ප්‍රකාශයට පත් කිරීම

*නෛතික යොමුව- අර්ථ නිරූපන ආඥා පනතේ 17(1)*

ගාස්තු අය කිරීම පිළිබඳ සභා තීරණයක් ගැනීමෙන් අනතුරුව එකී ගාස්තු ජනතාවගේ දැනගැනීම සඳහා ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කිරීම සම්මත ක්‍රමය වන්නේය.

### 4.19.2 ගාස්තු අය කර ගැනීම

කිසියම් තැනැත්තෙකු ප්‍රජා ශාලාව, නගර ශාලාව හෝ ක්‍රීඩා පිටිය වෙන්කර ගැනීම සඳහා නියමිත ආකෘති පත්‍රයක් මගින් ඉල්ලීම් කිරීමෙන් අනතුරුව සභාව තීරණය කර ඇති ගාස්තු ප්‍රමාණයන් ගණන් බලා එකී ගාස්තු අයකරගත යුතුවේ. ඒ සමගම වෙන් කර ගන්නා ලද දිනය අදාල ලේඛනයේ සටහන් කර ගත යුතු වේ. වෙන්කර ගත් දින නියමිත කාලයට අමතර කාලයක් පරිහරණය කරන්නේ නම් ඊට අදාල ගාස්තු අය කර ගැනීම පියවර ගත යුතුය.

## 4.20 ගොඩනැගිලි බලපත්‍ර ආදායම්

පළාත් පාලන ආයතන බල ප්‍රදේශය තුල කිසියම් ඉදි කිරීමක්, සංවර්ධන කාර්යයන් සිදු කරනු ලබන්නේ නම් ඒ සඳහා පළාත් පාලන ආයතනයෙන් නිසි අවසරයක් ලබා ගත යුතුය. එකී අවසරව ලබාදීමේදී අයකරනු ලබන ගාස්තු ආශ්‍රිත මෙසේ පළාත් පාලන ආයතන වල ආදායම් ප්‍රභවයන් බවට පත්වී ඇත.

**මේ සම්බන්ධයෙන් අවධානය යොමුකල යුතු විෂය ක්ෂේත්‍ර (Attention Area)**

i. අයදුම්පත් ලබා ගැනීම

ii. ක්ෂේත්‍ර නිරීක්ෂණය

iii. සැලසුම් කමිටුවේ අනුමැතිය

### 4.20.1 අයදුම්පත් ලබා ගැනීම

මීට අදාලව නෛතිකව අනුගමනය කළ යුතු කාර්ය පියවරයන් පහත දැක්වේ. (Compliance Procedures)

i. අයදුම්පත් ලබා ගැනීම

*නෛතික යොමුව- නාගරික සංවර්ධන අධිකාරී පනත යටතේ නිකුත්*

*කර ඇති නියෝග 1986.03.10 දිනැති අංක 392/9 අති විශේෂ ගැසට් නිවේදනය, නිවාස හා නගර සංවර්ධන ආඥා පනත*

පළාත් පාලන බල ප්‍රදේශය තුල කිසියම් ඉදි කිරීමක් සිදු කරන්නේ නම් ඒ සඳහා පළාත් පාලන ආයතනය විසින් නිකුත් කරනු ලබන ගොඩනැඟිලි අයදුම් පත්‍රයක් ලබා ගැනීම කල යුතු වේ. අයදුම්පත්‍ර ගාස්තුව සභාව විසින් තීරණය කරනු ලබන අතර එය ගොඩනැඟිලි අයදුම්පත් ලේඛනයට ඇතුලත් කර ලියා පදිංචි කරනු ලැබේ.

### 4.20.2 ක්ෂේත්‍ර සමීක්ෂණ

මීට අදාලව නෛතිකව අනුගමනය කළ යුතු කාර්ය පියවරයන් පහත දැක්වේ. (Compliance Procedures&

i. **ක්ෂේත්‍ර නිරීක්ෂණ**

*නෛතික යොමුව- නාගරික සංවර්ධන අධිකාරී පනත යටතේ නිකුත් කර ඇති නියෝග 1986.03.10 දිනැති අංක 392/9 අති විශේෂ ගැසට් නිවේදනය, නිවාස හා නගර සංවර්ධන ආඥා පනතේ විධිවිධානයන්*

නියමිත පරිදි සම්පූර්ණ කරන ලද ගොඩනැගිලි අයදුම්පත්‍රය ලියා පදිංචි කිරීමෙන් අනතුරුව අදාල ඉඩමේ හිමිකාරත්වය පිළිබඳව තක්සේරුව ශාඛාව වෙතින් ලබා ගැනීම කල යුතු වේ. ඉන් අනතුරුව මහජන සෞඛ්‍ය පරික්ෂක හා තාක්ෂණ නිළධාරී වෙත යොමු කර ක්ෂේත්‍ර පරික්ෂණයක් සිදු කරනු ලැබේ. පරීක්ෂණයෙන් අනතුරුව නිර්දේශය සහිත වාර්තාව සැලසුම් කමිටුව යොමු කෙරේ.

### 4.20.3 සැලසුම් කමිටුවේ අනුමැතිය

මීට අදාලව නෛතිකව අනුගමනය කළ යුතු කාර්ය පියවරයන් පහත දැක්වේ. (Compliance Procedures)

i. **ස්ථානීය නිරීක්ෂණ වාර්තාව සමාලෝචනය කිරීම**

*නෛතික යොමුව- නාගරික සංවර්ධන අධිකාරී පනත යටතේ නිකුත් කර ඇති නියෝග 1986.03.10 දිනැති අංක 392/9 අති විශේෂ ගැසට් නිවේදනය*

අදාල ඉදි කිරීම් සිදු කරන භූමිය පිළිබඳව ස්ථානිය නිරීක්ෂණයකින් හා නිර්දේශිත වාර්තා සැලසුම් කමිටුවට යොමු කරනු ඇත. සැලසුම් කමිටුව විසින් එම වාර්තා සමාලෝචනය කර අනුමත කිරීම හෝ නොකිරීම සිදු කරනු ලැබේ.

ii. බලපත්‍ර නිකුත් කිරීම

*නෛතික යොමුව- නාගරික සංවර්ධන අධිකාරී පනත යටතේ නිකුත් කර ඇති නියෝග 1986.03.10 දිනැති අංක 392/9 අති විශේෂ ගැසට් නිවේදනය*

ගොඩනැගිලි අයදුම් පත්‍රය සැලසුම් කමිටුව විසින් අනුමැතිය ලබා දෙන්නේ නම් සභාපති/නාගරික කොමසාරිස් විසින් අනුමත කරන ලද සැලැස්මේ පිටපතක් සමග සභාව විසින් පනවන ලද කොන්දේසිද ඇතුලත්ව ඉදිකිරීම් බලපත්‍රය ඉල්ලුම්කරු වෙත නිකුත් කරනු ලැබේ.

9 789550 168248